# පාර්ලිමේන්තු විත්ති

පුවත් හසුන | 35 වැනි කාණ්ඩය | මැයි 2023

## පාර්ලිමේන්තුවේ නව මහලේකම් කුෂානි රෝහණදීර මහත්මිය ධුරයේ රාජකාරී අරඹයි....



පාර්ලිමේන්තුවේ මහලේකම් ධුරයට අභිනවයෙන් පත්වූ කුෂානි රෝහණදීර මහත්මිය සිය ධුරයේ රාජකාරී ආරම්භ කිරීම මැයි මස 23 වැනිදා පෙරවරුවේ සිදුවිය.

# අන්තර්ගතය



## පුවත්

- පාර්ලිමේන්තුවේ නව මහලේකම් කුෂානි රෝහණදීර මහත්මිය ධුරයේ රාජකාරී අරඹයි.
- ටිකිරි කේ. ජයතිලක මහතා පාර්ලිමේන්තුවේ කාර්ය මණ්ඩල ප්‍රධානී සහ නියෝජ්‍ය මහ ලේකම් ධුරයට පත් කෙරේ.
- හිටපු මහලේකම් ධම්මික දසනායක මහතාගේ සේවයට පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලයේ ප්‍රණාමය පුද කෙරේ.
- (IMF) නියෝජ්‍ය කළමනාකාර අධ්‍යක්ෂවරයා පාර්ලිමේන්තුවේදී කථානායකවරයා හමුවෙයි.
- උතුරේ සිසුන් 700ක් පාර්ලිමේන්තුව නැරඹීමට පැමිණේ.
- "පාර්ලිමේන්තු සාර සංහිතා" ශාස්ත්‍රීය සංග්‍රහයේ තෙවැනි වෙළුම එළි දැක්වීම ගරු කථානායකවරයාගේ ප්‍රධානත්වයෙන් පාර්ලිමේන්තුවේදී.
- පාර්ලිමේන්තු සාර සංහිතා විමර්ශිත ශාස්ත්‍රීය සංග්‍රහයේ සිව්වැනි වෙළුම සඳහා ලිපි කැඳවීම ආරම්භ කෙරේ.
- පාර්ලිමේන්තුවේ හිටපු මහලේකම් ධම්මික දසනායක මහතාගේ සේවය පාර්ලිමේන්තුවේදී ඇගයීමට ලක් වෙයි.
- ශ්‍රී ලංකා - සෞදි අරාබි පාර්ලිමේන්තු මිත්‍රත්ව සංගමයේ සභාපතිවරයා ලෙස අමාත්‍ය නසීර් අහමඩ් මහතා තේරී පත් වෙයි.
- ශ්‍රී ලංකාවේ තායිලන්ත තානාපතිවරයා සහ කථානායකවරයා අතර හමුවක්.
- වෙසක් පොහොය නිමිත්තෙන් පාර්ලිමේන්තුවේදී විශේෂ ධර්ම දේශනයක්.

## කාරක සභා පුවත්

- උසස් අධ්‍යාපනයේ ප්‍රතිසංස්කරණ රැසක් පිළිබඳව කෝප් කමිටුවෙන් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට නිර්දේශ.
- ළමා වින්දිතයන් සහ චූදිතයන් මාධ්‍ය මගින් නිරාවරණය කිරීම වැළැක්වීම සඳහා වහා පියවර ගත යුතුයි - ළමයින් පිළිබඳ පාර්ලිමේන්තු සංසදයේ සභාපති රෝහිණී කුමාරි විජේරත්න.
- රූපවාහිනී නාලිකා ශ්‍රේණිගතකිරීමේ ක්‍රමය (Rating) නිවැරදි නැහැ - ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම් අනුෂ පැල්පිට මහතා කෝපා කමිටුවේදී පවසයි.
- දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට 2022 දෙසැම්බර් 31 දින වන විට ලැබිය යුතු මුලු හිඟ බදු, දඩ හා පොළී මුදල රුපියල් බිලියන 904 ක් - කෝපා කමිටුවේදී හෙළි වෙයි.



- වෘත්තීය පුහුණු අධිකාරියේ පරිපාලනය සම්පූර්ණයෙන් බිඳ වැටිලා - අධ්‍යක්ෂ ජනරාල් ඇතුළු ප්‍රධාන තනතුරු 7 ක් පුරප්පාඩු - කෝප් කමිටුවේදී අනාවරණය වෙයි.

- නීති විරෝධී සංක්‍රමණ වැළැක්වීම සදහා වෙනම ඒකකයක් ක්‍රියාත්මක කොට මාස තුනකින් ප්‍රගතිය වාර්තා කරන ලෙස  ස්ත්‍රී-පුරුෂ සමතාව සහ සමානාත්මතාවය තහවුරු කිරීමට සහ ඒ පිළිබඳව සොයා බලා සිය නිර්දේශ පාර්ලිමේන්තුවට වාර්තා කිරීම සඳහා වූ පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවෙන් අදාළ අංශවලට උපදෙස්.

- යු.ජී.සී අනුමතිය ලබාදීම උපාධි ප්‍රදානය කරන විශ්ව විද්‍යලයට පමණක් සීමා විය යුතුයි - උසස් අධ්‍යාපන අවස්ථා පුළුල් කිරීමේ විශේෂ කාරක සභාවේදී සාකච්ඡා කෙරේ.

- වීසා කාලය ඉක්මවා ඇති විදේශිකයන්ගෙන් වීසා ගාස්තු වලට අමතරව අතිවාස කාල සීමාව සඳහා අයකරනු ලබන දඩ මුදල අඩු කිරීමේ නියෝගවලට අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ අනුමතිය.

- ජාතික ප්‍රතිපත්ති කොමිෂන් සභාව පිහිටුවීමේ මාර්ග සැලැස්ම පිළිබඳ ජාතික සභා ප්‍රතිපත්ති සම්පාදන අනු කාරක සභාවේ අවධානය.

- ශ්‍රී ලංකාවේ පළමු න්‍යෂ්ටික බලාගාරය 2032 වන විට ඉදිකළ හැකියි - ආංශික අධීක්ෂණ කාරක සභාවේදී ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය පවසයි.

- දේශීය ආදායම් දෙපාර්තමේන්තුව ජාතික ආර්ථිකයට දක්වන දායකත්වය පිලිබඳ ජාතික ආර්ථික හා භෞතික සැලසුම් පිලිබඳ  ආංශික අධීක්ෂණ කාරක සභාවේ සාකච්ඡා කෙරේ.

- විශ්‍රාම වැටුප් අප්‍රමාදව ගෙවීමේ ක්‍රමවේදය විධිමත් කර ඒ පිළිබඳ ජනතාව දැනුවත් කරන්න -  විවෘත සහ වගකිවයුතු රජයක් පිලිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවෙන් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට උපදෙස්.

- පාර්ලිමේන්තුවේ ආංශික අධීක්ෂණ කාරක සභා සමග සම්බන්ධවීමට තෝරා ගැණුනු තරුණ නියෝජිතයන් දැනුවත් කිරීමේ විශේෂ වැඩසටහනේ සමාරම්භක උත්සවය මැයි මස (13) වැනිදා බත්තරමුල්ල වෝටර්ස් එජ් හෝටල් පරිශ්‍රයේදී පවත්වයි.

- සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රම සඳහා ප්‍රතිලාභීන් තෝරා ගැනීමේදී නිසි ක්‍රමවේදයක් අනුගමනය කළ යුතුයි - ක්‍රම සහ විධි පිළිබඳ කාරක සභාවේදී අවධාරණය  කෙරේ

පාර්ලිමේන්තු ඡායා ගැලරිය

# කවරයේ කතාව



## පාර්ලිමේන්තුවේ නව මහලේකම් කුෂානි රෝහණදීර මහත්මිය ධුරයේ රාජකාරී අරඹයි

පාර්ලිමේන්තුවේ මහලේකම් ධුරයට අභිනවයෙන් පත්වූ කුෂානි රෝහණදීර මහත්මිය සිය ධුරයේ රාජකාරී ආරම්භ කිරීම මැයි මස 23 වැනිදා පෙරවරුවේ සිදුවියී

නව ධුරයේ රාජකාරී ආරම්භ කිරීම සදහා අද පෙරවරුවේ පාර්ලිමේන්තුවට පැමිණි රෝහණදීර මහත්මිය, සහකාර මහලේකම්වරුන් වන ටිකිරි කේ. ජයතිලක සහ හංස අබේරත්න යන මහත්වරුන් විසින් පිළිගන්නා ලදී.

කථානායක ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා ඉදිරියේ නව මහලේකම්වරිය නිල ප්‍රතිඥාව ලබා දීමෙන් අනතුරුව මහා සංඝරත්නය පිරිත් සජ්ඣායනා කොට ආශීර්වාද එක්කිරීම සිදු කළහ. ඉන්පසු පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද, කථානායකවරයා විසින් සහතික කිරීමට නියමිත රතනතිස්ස සාම පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත සත්‍ය පිටපතක් බව සහතික කරමින් ඇය පාර්ලිමේන්තුවේ මහලේකම් ධුරයේ රාජකාරී ආරම්භ කළාය.

පාර්ලිමේන්තුවේ හිටපු මහලේකම් ධම්මික දසනායක මහතා, රෝහණදීර මහත්මියගේ පවුලේ සාමාජිකයන්, පාර්ලිමේන්තුවේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් ඇතුළු පිරිසක් මෙම අවස්ථාවට එක්ව සිටියහ.

අද පෙ,ව 9.30 පාර්ලිමේන්තු රැස්වීම ආරම්භ කරමින් වේත්‍රධාරීවරයා පෙරටුකරගනිමින් කථානායකවරයා, මහලේකම්වරිය ඇතුළු ලේකම් මඩුල්ල සභා ගර්භයට ප්‍රවිශ්ට වූහ.

මෙහිදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 65(1) ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව, ගරු ජනාධිපතිතුමා විසින් කාර්ය මණ්ඩල ප්‍රධානි සහ පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම්, කුෂානි අනූෂා රෝහණදීර මහත්මිය, 2023 මැයි 23 දින සිට පාර්ලිමේන්තුවේ මහ ලේකම් තනතුරට පත් කර ඇති බව කථානායක ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා නිවේදනය කළේය.

එසේම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව, පාර්ලිමේන්තුවේ මහ ලේකම් ධුරය දැරූ, ධම්මික දසනායක මහතා, එම ධුරයෙන් 2023 මැයි 23 දින සිට විශ්‍රාම ගිය බවද කථානායකවරයා නිල වශයෙන් දැනුම් දුන්නේය.

අම්බලන්ගොඩ ධර්මාශෝක විද්‍යාලයෙන් ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපනය හදාරා ඇති රෝහණදීර මහත්මිය කොළඹ විශ්වවිද්‍යාලයේ ජීව විද්‍යාව පිළිබඳ උපාධිධාරිණියකි. එසේම ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ නීතිවේදී (LLB) උපාධිය ද හිමි ඇය නීතිඥවරියකි.

1999 වසරේදී පාර්ලිමේන්තු නිලධාරිනියක ලෙස පාර්ලිමේන්තු මහලේකම්වරයාගේ කාර්ය මණ්ඩලයට එක්විය. අනතුරුව සහකාර ප්‍රධාන නිලධාරී, නියෝජ්‍ය ප්‍රධාන නිලධාරී, සහකාර මහලේකම්, නියෝජ්‍ය මහලේකම් සහ කාර්ය මණ්ඩල ප්‍රධානී යන තනතුරුවලට උසස්වීම් ලැබුවාය.

පාර්ලිමේන්තු සේවයට සම්බන්ධවීමට පෙර ඇය සම්පත් බැංකුවේ කනිෂ්ඨ විධායක නිලධාරිනියක, පරිසර පදනමේ කනිෂ්ඨ විද්‍යාඥවරියක, ජාතික අධ්‍යාපන ආයතනයේ (දුරස්ථ අධ්‍යාපනික) අධ්‍යක්ෂවරයාගේ ලේකම්වරිය, ඉන්ෆොමැටික්ස් පෞද්ගලික ආයතනයේ මධ්‍යස්ථාන සම්බන්ධීකාරක ලෙස ද කටයුතු කර ඇත.

එසේම ඇය ඉන්දියාව, කැනඩාව ඇතුළු රටවල් ගණනාවක පාර්ලිමේන්තු ක්‍රියාදාමය සහ ව්‍යවස්ථාදායක ක්‍රියාවලිය පිළිබඳ පුහුණුවීම් ලබා ඇත.

නීතිඥ හරිගුප්ත රෝහණදීර මහතා සමග විවාහ වී සිටින ඇය ඉවුම් පිහුම් කටයුතු සහ ගායනයට ප්‍රිය කරන දරුවන් තිදෙනෙකුගේ මවකි.







# ටිකිරි කේ. ජයතිලක මහතා පාර්ලිමේන්තුවේ කාර්ය මණ්ඩල ප්‍රධානී සහ නියෝජ්‍ය මහ ලේකම් ධුරයට පත් කෙරේ

පාර්ලිමේන්තුවේ නව කාර්ය මණ්ඩල ප්‍රධානී සහ නියෝජ්‍ය මහ ලේකම් ධුරයට සහකාර මහ ලේකම් ලෙස කටයුතු කළ ටිකිරි කේ. ජයතිලක මහතා 2023. 05. 23 දින සිට පත් කළ බව නියෝජ්‍ය කථානායක ගරු අජිත් රාජපක්ෂ මහතා මැයි මස 24 වැනිදා පාර්ලිමේන්තුවට නිවේදනය කළේය.

2002 වර්ෂයේ දී නීතිපති දෙපාර්තමේන්තුවට සම්බන්ධ වීමෙන් සිය වෘත්තීය දිවිය ආරම්භ කළ ටිකිරි කේ. ජයතිලක මහතා රජයේ අධිනීතිඥයෙකු ලෙස මහේස්ත්‍රාත් අධිකරණ සහ මහාධිකරණ රැසක නඩු කටයුතු මෙහෙයවා තිබේ. වර්ෂ 2006 දී අධිකරණ සේවයට සම්බන්ධ වූ ජයතිලක මහතා මහේස්ත්‍රාත්වරයෙකු සහ අතිරේක දිසා විනිසුරුවරයෙකු ලෙස සේවය කරමින් ලංකාවේ විවිධ ප්‍රදේශවල අධිකරණ ගණනාවක සේවය කොට ඇත.

2015 වර්ෂයේ දී සහකාර මහ ලේකම්වරයෙකු ලෙස ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ සේවයට එක්වන ජයතිලක මහතා ව්‍යවස්ථාදායක සේවා පිළිබඳ සහකාර මහ ලේකම්වරයා ලෙස කටයුතු කළේය.

ටිකිරි කේ. ජයතිලක මහතා කොළඹ විශ්වවිද්‍යාලයේ නීති පීඨයෙන් නීතිවේදී උපාධිය ද, නෝතම්බ්‍රියා විශ්වවිද්‍යාලයෙන් නීතිපති උපාධිය ද හදාරා ඇත. ඒ මහතා ප්‍රජා පාදක විශෝධනය පිළිබඳ ග්‍රන්ථයක්ද පළ කොට තිබේ.

# හිටපු මහලේකම් ධම්මික දසනායක මහතාගේ සේවයට පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලයේ ප්‍රණාමය පුද කෙරේ



පාර්ලිමේන්තුවේ මහ ලේකම් ධුරයට සහ 29 වසරක සිය පාර්ලිමේන්තු සේවයට මැයි මස 23 වැනිදා සමුදුන් ධම්මික දසනායක මහතාගේ මෙහෙවර ඇගයීමේ සහ විශ්‍රාම දිවියට සුභපැතුම් පිරිනැමීමේ උත්සවයක් පසුගියදා කථානායක ගරු මහින්ද යාපා අබේවර්ධන මහතාගේ ප්‍රධානත්වයෙන් පාර්ලිමේන්තු සංකීර්ණයේදී පැවැත්විණි.

මෙම අවස්ථාවට නියෝජ්‍ය කථානායක ගරු අජිත් රාජපක්ෂ, නියෝජ්‍ය කාරක සභා සභාපති ගරු අංගජන් රාමනාදන්, පාර්ලිමේන්තුවේ වත්මන් මහ ලේකම් කුෂානි රෝහණදීර, වත්මන් කාර්ය මණ්ඩල ප්‍රධානී සහ නියෝජ්‍ය මහ ලේකම් ටිකිරි ජයතිලක සහ සහකාර මහ ලේකම් හංස අබේරත්න යන මහත්ම මහත්මීන් එක්ව සිටියහ.

පාර්ලිමේන්තු මහ ලේකම් කාර්යාලයේ දෙපාර්තමේන්තු ප්‍රධානින් ඇතුලු කාර්ය මණ්ඩලය මෙන්ම පාර්ලිමේන්තුවට අනුබද්ධ කාර්ය මණ්ඩල වලට අයත් නිලධාරින්ද මහලේකම්වරයාගේ මෙහෙවර ඇගයීමට සහ ඔහුගේ විශ්‍රාම දිවියට සුභපැතුම් පිරිනැමීමේ අවස්ථාවට එක්ව සිටියහ.







# ශ්‍රී ලංකාවට මෙම අවස්ථාවේදී උපරිම සහයෝගයක් ලබාදීමට අපේක්ෂා කරනවා - IMF නියෝජ්‍ය කළමනාකාර අධ්‍යක්ෂවරයා පාර්ලිමේන්තුවේදී කථානායකවරයා හමුවෙමින් පවසයි

■ **ශ්‍රී ලංකාවේ ආර්ථිකය යහපත් මාර්ගයට ගැනීම සඳහා අවශ්‍ය මූලික සාධනීය පියවරයන් රැසක් මේ වන විට ගෙන තිබීම අගය කරන බවද නියෝජ්‍ය කළමනාකාර අධ්‍යක්ෂවරයා පවසයි**



මේ අසීරු මොහොතේදී ශ්‍රී ලංකාවට සහය දැක්වීම සඳහා හැකි උපරිම දායකත්වය ලබා දීමට අපේක්ෂා කරන බව අන්තර්ජාතික මූල්‍ය අරමුදලේ නියෝජ්‍ය කළමනාකාර අධ්‍යක්ෂ කෙන්ජි ඔකමුරා මහතා පාර්ලිමේන්තුවේදී පැවසීය.

මැයි මස 31 වැනිදා පස්වරුවේ පාර්ලිමේන්තුවේදී කථානායක ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා ඇතුළු පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා සාමාජික මන්ත්‍රීවරයන් හමුවූ අවස්ථාවේදී ඒ මහතා මේබව පවසා සිටියේය.

එසේම නැවත ශ්‍රී ලංකාවේ ආර්ථිකය යහපත් මාර්ගයට ගැනීම සඳහා අවශ්‍ය මූලික සාධනීය පියවරයන් රැසක් මේ වන විට ගෙන තිබීම අගය කරන බවද කෙන්ජි ඔකමුරා මහතා පැවසීය.

මේ අසීරු අවස්ථාවේදී ශ්‍රී ලංකාවට සහය ලබා දීමට මැදිහත් වීම පිළිබඳව ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ කළමනාකාර අධ්‍යක්ෂ ක්‍රිස්ටලිනා ජෝර්ජියේවා මහත්මිය ප්‍රමුඛ සමස්ත අධ්‍යක්ෂවරුන්ට මෙරට රජය සහ ජනතාව වෙනුවෙන් සිය කෘතවේදීත්වය පුද කර සිටින බව කථානායකවරයා මෙහිදී IMF නියෝජ්‍ය කළමනාකාර අධ්‍යක්ෂවරයාට දන්වා සිටියේය.

එසේම පවතින අර්බුදය විසදා ගැනීමට ආර්ථික ස්ථායිකරණය සඳහා අවශ්‍ය දැඩි තීරණ ගැනීමට සිදු වූ බවද පාර්ලිමේන්තුව තුළින් ද ඒ සඳහා අවශ්‍ය පියවර ගෙන ඇති බව ද කථානායකවරයා පෙන්වා දුන්නේය. මනා විනිවිද භාවයකින් යුතු නව ආර්ථික දැක්මක් සඳහා පාර්ලිමේන්තුවේ අයවැය කාර්යාලයක් පිහිටුවීම, දූෂණ විරෝධී පනතක් හඳුන්වා දීමට පියවර ගැනීම, නව මහබැංකු පනතක් හඳුන්වා දීමට කටයුතු කිරීම ආදී වඩාත් සාධනීය පියවර රැසක් ඒ අනුව ගෙන ඇති බව කථානායකවරයා පෙන්වා දුන්නේය.

අද පස්වරුවේ පාර්ලිමේන්තුවට පැමිණි අන්තර්ජාතික මූල්‍ය අරමුදලේ නියෝජ්‍ය කළමනාකාර අධ්‍යක්ෂ කෙන්ජි ඔකමුරා මහතා පිළිගනු ලැබුවේ රාජ්‍ය අමාත්‍ය ගරු ශෙහාන් සේමසිංහ, පාර්ලිමේන්තුවේ කාර්ය මණ්ඩල ප්‍රධානී සහ නියෝජ්‍ය මහලේකම් ටිකිරි කේ ජයතිලක, සහකාර මහලේකම් හංස අබේරත්න සහ වේත්‍රධාරී නරේන්ද්‍ර ප්‍රනාන්දු යන මහත්වරුන් විසිනි.



කථානායකවරයා සමග පැවති සාකච්ඡාවෙන් අනතුරුව ඔකමුරා මහතා පාර්ලිමේන්තු සභාගර්භය නැරඹීම සිදුකළේය.

අනතුරුව ඒ මහතා  පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ සාමාජිකයන් සමග සුහද සාකච්ඡාවක ද නිරත විය.

එසේම අන්තර්ජාතික මූල්‍ය අරමුදලේ නියෝජ්‍ය කළමනාකාර අධ්‍යක්ෂ කෙන්ජි ඔකමුරා මහතා පාර්ලිමේන්තුවට පැමිණෙන විශේෂ අමුත්තන්ගේ ලේඛනයේ සමරු සටහනක් තැබීමට ද එක්විය.

මෙම අවස්ථාවට නියෝජ්‍ය කථානායක ගරු අජිත් රාජපක්ෂ, සභානායක අමාත්‍ය ගරු සුසිල් ප්‍රේමජයන්ත, අමාත්‍ය ගරු අලි සබ්‍රි, විපක්ෂයේ ප්‍රධාන සංවිධායක ගරු ලක්ෂ්මන් කිරිඇල්ල යන මහත්වරුන්  ඇතුළු පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ සාමාජික මන්ත්‍රීවරයන් පිරිසක් එක්ව සිටියහ. එසේම පාර්ලිමේන්තුවේ මහලේකම් කුෂානි රෝහණදීර මහත්මිය ප්‍රමුඛ පාර්ලිමේන්තු මහලේකම් මඩුල්ල ඇතුළු නිලධාරී පිරිසක්ද මෙම අවස්ථාවට සහභාගී වූහ.







පුවත්

# උතුරේ සිසුන් 700ක් පාර්ලිමේන්තුව නැරඹීමට පැමිණේ



යාපනයේ පාසල් ගණනාවක් නියෝජනය කරමින් සිසු සිසුවියයෝ 700කට අධික සංඛ්‍යාවක් මැයි මස 12 වැනිදා පාර්ලිමේන්තුව නැරඹීම සඳහා පැමිණියහ.

ඒ අනුව, පාර්ලිමේන්තුවේ මහජනසේවා අංශයේ නිලධාරීන් විසින් පැමිණි සිසුන් වෙනුවෙන් පාර්ලිමේන්තුවේ නැරඹුම් චාරිකාවක් සංවිධානය කර තිබිණි පාර්ලිමේන්තුවේ මහජන ගැලරියේ සිට පාර්ලිමේන්තු රැස්වීම් සජීවීව නැරඹීමේ අවස්ථාව සහ පාර්ලිමේන්තු සංකීර්ණය ඉදිරිපිටදී සමූහ ඡායාරූපයකට පෙනී සිටීමේ අවස්ථාවද මෙහිදී සිසුන්ට හිමි විය.

මෙහිදී පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය කාරක සභා සභාපති ගරු අංගජන් රාමනාදන්, හිටපු ජනාධිපති පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු මෛත්‍රීපාල සිරිසේන, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් වන ගරු දුෂ්මන්ත මිත්‍රපාල, ගරු රවුෆ් හකීම්, ගරු එරාන් වික්‍රමරත්න, ගරු උද්දික ප්‍රේමරත්න මෙන්ම පාර්ලිමේන්තුවේ මහ ලේකම් ධම්මික දසනායක සහ වේත්‍රධාරී නරේන්ද්‍ර ප්‍රනාන්දු යන මහත්වරුන් හමුවීමටද සිසුන්ට අවස්ථාව හිමි විය.

ඒ අනුව, වඩමාරාච්චි කාන්තා මධ්‍ය විද්‍යාලය, තොන්ඩෙමනාරු වීරකත්තිපිලලෙයාර් මහා විද්‍යාලය, වල්වෙව කාන්තා මහා විද්‍යලය, නෙල්ලියඩි මහා විද්‍යාලය, පොලිකන්ඩි හින්දු දෙමළ මිශ්‍ර පාසල, උඩුපිට්ටි කාන්තා විද්‍යාලය, විග්නේෂ්වරා විද්‍යාලය, කරවෙට්, වේලායුදම් මහා විද්‍යාලය, වඩමාරාච්චි හින්දු කාන්තා විද්‍යාලය, මෙඩ්රිස්තා කාන්තා විද්‍යාලය, කොට්ට්‍රාවත්තෙත විදුහල යන පාසල් නියෝජනය කරමින් සිසු සිසුවියන් මෙලෙස පාර්ලිමේන්තු චාරිකාවට එක්ව සිටියහ.

කොවිඩ් වසංගතය හේතුවෙන් වසා තබන ලද මහජන ගැලරිය පාසැල් ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහා පසුගිය වසරේ සැප්තැම්බර් 19 වන දින සිට නැවත විවෘත කළ අතර, දිවයිනේ පාසල්, විශ්ව විද්‍යාල, වෙනත් අධ්‍යන ආයතන නියෝජනය කරමින් දහස් ගණනක් සිසුන් සෑම දිනකම පාර්ලිමේන්තුව නැරඹීමට පැමිණේ. එසේ පැමිණෙන සිසුන් සඳහා සියළු පහසුකම් සැලසීම පාර්ලිමේන්තුවේ වේත්‍රධාරී දෙපාර්තමේන්තුව විසින් සිදු කරන අතර නැරඹුම් චාරිකා සහ දැනුවත් කිරීමේ වැඩමුළු සංවිධානය කිරීම මෙන්ම ඒවාට අදාළ සමරු ඡායාරූප හා වීඩියෝ දර්ශන නිකුත් කිරීම පාර්ලිමේන්තුවේ සන්නිවේදන දෙපාර්තමේන්තුව මගින් සිදු කරනු ලබයි.



# "පාර්ලිමේන්තු සාර සංහිතා" ශාස්ත්‍රීය සංග්‍රහයේ තෙවැනි වෙළුම එළි දැක්වීම ගරු කථානායකවරයාගේ ප්‍රධානත්වයෙන් පාර්ලිමේන්තුවේදී



පාර්ලිමේන්තුවේ සන්නිවේදන දෙපාර්තමේන්තුව විසින් සංස්කරණය කර ප්‍රකාශයට පත් කරන පාර්ලිමේන්තු සාර සංහිතා ශාස්ත්‍රීය සංග්‍රහයේ තෙවැනි වෙළුම එළි දැක්වීම කථානායක ගරු මහින්ද යාපා අබේවර්ධන මහතාගේ ප්‍රධානත්වයෙන් අප්‍රේල් මස 11 වැනිදා පාර්ලිමේන්තුවේදී සිදු විය.

මෙහිදී "පාර්ලිමේන්තු සාර සංහිතා" ශාස්ත්‍රීය සංග්‍රහයේ තෙවැනි වෙළුමේ පළමු පිටපත පාර්ලිමේන්තුවේ මහලේකම් ධම්මික දසනායක මහතා විසින් ගරු කථානායක මහින්ද යාපා අබේවර්ධන මහතා වෙත පිළිගන්වන ලදි.
එසේම පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශවයේ නායක ගරු සජිත් ප්‍රේමදාස මහතාට සහ ප්‍රවාහන හා ජනමාධ්‍ය අමාත්‍ය ගරු බන්දුල ගුණවර්ධන යන මහත්වරුන්ටද මෙම අවස්ථාවේදී "පාර්ලිමේන්තු සාර සංහිතා" ශාස්ත්‍රීය ග්‍රන්ථය පාර්ලිමේන්තුවේ මහලේකම්වරයා විසින් පිළිගන්වන ලදි.

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ මහලේකම් ධම්මික දසනායක මහතාගේමගපෙන්වීම යටතේ " පාර්ලිමේන්තු සාර සංහිතා " ශාස්ත්‍රීය සංග්‍රහයට ලිපි ලබාගැනීම පසුගිය වසරේදී සිදු කළේය. එහිදී "ගෝලීයකරණ හා ප්‍රතිගෝලීයකරණ ප්‍රවණතා හමුවේ පාර්ලිමේන්තු ක්‍රියාදාමය" යන ප්‍රධාන තේමාව මත පිහිටමින් සමාජ මාධ්‍ය, ප්‍රජා සහභාගීත්වය හා පාර්ලිමේන්තුව පිළිබඳ ප්‍රජා සංජානනය, ගෝලීයකරණය හා අන්තර්ජාතික සම්බන්ධතා, පාර්ලිමේන්තුවේ ව්‍යවස්ථාදායක බලය හා ප්‍රජාතන්ත්‍රවාදය, තොරතුරු සමාජය, සන්නිවේදනය, ව්‍යවස්ථාදායක ක්‍රියාවලිය හා පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය, නව සාමාන්‍යකරණ තත්ත්ව යටතේ නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදය, දේශපාලනයේ ස්ත්‍රීහු හා තරුණයෝ, දේශපාලන සංස්කෘතිය, සමාජානුයෝජනය, ප්‍රජාතන්ත්‍රවාදය හා අධ්‍යාපනය, පාර්ලිමේන්තු සන්නිවේදනය හා ජාතික භාෂා ප්‍රතිපත්තිය, ව්‍යවස්ථාදායක ක්‍රියාවලිය හා මාධ්‍ය බලපෑම, අතථ්‍ය මහජන අවකාශය හා ප්‍රජාතන්ත්‍රවාදය යළි සලකා බැලීම සහ ආබාධ සහිත තැනැත්තන්ගේ යහ පැවැත්ම යන අනුතේමා යටතේ ලිපි ලබාගැනීම සිදුවිය.



මෙහි සමාලෝචන මණ්ඩලය ලෙස ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය රත්නසිරි අරංගල, කොළඹ විශ්වවිද්‍යාලයේ මහාචාර්ය ජයදේව උයන්ගොඩ, කොළඹ විශ්වවිද්‍යාලයේ මහාචාර්ය අජන්තා හපුආරච්චි, කැලණිය විශ්වවිද්‍යාලයේ මහාචාර්ය එස්.ජී යෝගරාජා, කොළඹ විශ්වවිද්‍යාලයේ ශ්‍රී පාලි මණ්ඩපයේ මහාචාර්ය ටියුඩර් වීරසිංහ සහ කැලණිය විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය විජයානන්ද රූපසිංහ යන මහත්ම මහත්මීහු සහභාගී වූහ.

"පාර්ලිමේන්තු සාර සංහිතා" ශාස්ත්‍රීය සංග්‍රහයේ තෙවැනි වෙළුමද ඉදිරියේදී දිවයිනේ පුස්තකාල වෙත සහ අනෙකුත් අවශ්‍ය පාර්ශ්ව වෙත ලබාදීමට නියමිතය.

එසේම "පාර්ලිමේන්තු සාර සංහිතා" විමර්ශිත ශාස්ත්‍රීය සංග්‍රහයේ සිව්වැනි වෙළුම සඳහාද ශාස්ත්‍රීය ලිපි කැඳවීම නිල වශයෙන් ආරම්භ කරන බව පාර්ලිමේන්තුවේ අධ්‍යක්ෂ ව්‍යවස්ථාදායක සේවා සහ අධ්‍යක්ෂ සන්නිවේදන (වැඩ බලන) එච්.ඊ. ජනකාන්ත සිල්වා මහතා විසින් මෙම අවස්ථාවේදී ප්‍රකාශයට පත්කරන ලදි.

ඒ අනුව "පශ්චාත් ගෝලීය තත්ත්වය හමුවේ පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදයේ වර්තමානය හා අනාගතය" යන ප්‍රධාන තේමාව ඔස්සේ අනු තේමා 07ක් ඔස්සේ ලිපි කැඳවා තිබේ.

මෙම අවස්ථාවට විශ්වවිද්‍යාල ක්ෂේත්‍රය නියෝජනය කරන විද්වතුන්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් සහ තවත් ක්ෂේත්‍ර ගණනාවක් නියෝජනය කරන විද්වතුන් සහ පාර්ලිමේන්තුවේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් ඇතුලු පිරිසක් සහභාගී විය.









පුවත්

# පාර්ලිමේන්තු සාර සංහිතා විමර්ශිත ශාස්ත්‍රීය සංග්‍රහයේ සිව්වැනි වෙළුම සඳහා ලිපි කැඳවීම ආරම්භ කෙරේ








"පාර්ලිමේන්තු සාර සංහිතා" විමර්ශිත ශාස්ත්‍රීය සංග්‍රහයේ සිව්වැනි වෙළුම සඳහාද ශාස්ත්‍රීය ලිපි කැඳවීම නිල වශයෙන් ආරම්භ කරන බව පාර්ලිමේන්තුවේ අධ්‍යක්ෂ ව්‍යවස්ථාදායක සේවා සහ අධ්‍යක්ෂ සන්නිවේදන (වැඩ බලන) එච්.ඊ. ජනකාන්ත සිල්වා මහතා විසින් පාර්ලිමේන්තු සාර සංහිතා ශාස්ත්‍රීය සංග්‍රහයේ තෙවැනි වෙළුම එළි දැක්වීමේ අවස්ථාවේදී ප්‍රකාශයට පත්කරන ලදි.

ඒ අනුව "පශ්චාත් ගෝලීය තත්ත්වය හමුවේ පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදයේ වර්තමානය හා අනාගතය" යන ප්‍රධාන තේමාව ඔස්සේ අනු තේමා 07ක් ඔස්සේ ලිපි කැඳවා තිබේ.

# පාර්ලිමේන්තු සාර සංහිතා: විමර්ශිත ශාස්ත්‍රීය සංග්‍රහය

## සිව්වැනි වෙළුම සඳහා ලිපි කැඳවීම
















ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ සන්නිවේදන දෙපාර්තමේන්තුව විසින් සම්පාදනය කරනු ලබන
පාර්ලිමේන්තු සාර සංහිතා: විමර්ශිත ශාස්ත්‍රීය සංග්‍රහය
සිව්වැනි වෙළුම සඳහා ලිපි භාරගනු ලැබේ.

## පශ්චාත් ගෝලීය තත්ත්වය හමුවේ පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදයේ වර්තමානය හා අනාගතය

**යන ප්‍රධාන තේමාව මත පහත සඳහන් අනුතේමා යටතේ ලිපි සම්පාදනය කළ හැකිය**

- පශ්චාත් ගෝලීයත්වය හා පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය
- කාරක සභා ක්‍රමය හා විවෘත පාර්ලිමේන්තුව
- පශ්චාත් ගෝලීය අවකාශය තුළ ජාතික ආර්ථික උපායමාර්ග
- නූතන මාධ්‍ය ප්‍රවණතා හමුවේ ජාතික තොරතුරු සුරක්ෂිතතාව
- පශ්චාත් ගෝලීය අවකාශය තුළ පුරවැසි භූමිකාව
- පශ්චාත් ගෝලීය ප්‍රවණතා හමුවේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ
- පශ්චාත් සංස්කෘතික අවකාශය හා පුද්ගල සමාජානුයෝජනය

ශාස්ත්‍රීය ලිපි භාරගන්නා
අවසාන දිනය
2023.08.13

### මාර්ගෝපදේශ

1. වචන 3500 - 5000 අතර විය යුතු ය.
2. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන භාෂාවන්ගෙන් ලිපි සම්පාදනය කළ හැකි ය.
3. සිංහල ලිපි සඳහා FM Abhaya, ඉංග්‍රීසි ලිපි සඳහා Times New Roman, දෙමළ ලිපි සඳහා Bamini අක්ෂර රූපාකාර භාවිත කළ යුතු ය.
4. අකුරු ප්‍රමාණය - සිංහල හා දෙමළ පොයින්ට් 12
   - ඉංග්‍රීසි පොයින්ට් 11
5. පේළි අතර 1.5 පරතරය යෙදිය යුතු ය.
6. පිටුවේ පහත කෙළවරේ පිටු අංක යෙදිය යුතු ය.
7. මූලාශ්‍රය සටහන් හා විමර්ශිත ග්‍රන්ථ නාමාවලිය APA ක්‍රමයට දැක්විය යුතු ය.
8. සිංහල සහ දෙමළ භාෂාවලින් සම්පාදනය වන ලිපි වල සංක්ෂේපය ඉංග්‍රීසි භාෂාවෙන්ද, ඉංග්‍රීසි භාෂාවෙන් සම්පාදනය වන ලිපි වල සංක්ෂේපය සිංහල හෝ දෙමළ භාෂාවෙන්ද සකස්විය යුතුය.

### ශාස්ත්‍රීය ලිපි සකස් විය යුතු ආකෘතිය

සංක්ෂේපය : වචන 250 - 300 අතර විය යුතු ය.
මූඛ්‍ය පද : අවම මූඛ්‍ය පද 3කට හා උපරිම 5කට සීමා විය යුතු ය.

1. හැඳින්වීම
2. පර්යේෂණ ක්‍රමවේදය
3. සාකච්ඡාව
4. සමාලෝචනය
5. විමර්ශිත ග්‍රන්ථ

වැඩිදුර තොරතුරු සඳහා: දුරකථන අංක 0778886676 / 0112 777328
ආසිරි හපුගොඩ (මාධ්‍ය නිලධාරි ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව)
ලිපි පහත විද්‍යුත් ලිපිනය වෙත එවීමට කාරුණික වන්න.
journal.slparliament@gmail.com

අධ්‍යක්ෂ - සන්නිවේදන,
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව,
ශ්‍රී ජයවර්ධනපුර,
කෝට්ටේ.

# පාර්ලිමේන්තුවේ හිටපු මහලේකම් ධම්මික දසනායක මහතාගේ සේවය පාර්ලිමේන්තුවේදී ඇගයීමට ලක් වෙයි



■ **කථානායකවරුන් හත් දෙනෙකු යටතේ මෙන්ම ආණ්ඩු ගණනාවක් තුළ පාර්ලිමේන්තුවේ ස්වාධීනත්වය සහ ගෞරවය ආරක්ෂා කිරීමට හිටපු මහලේකම්වරයාට හැකියාව ලැබුණා - අග්‍රාමාත්‍ය ගරු දිනේශ් ගුණවර්ධන මහතා**

■ **පාර්ලිමේන්තුවෙන් ජනාධිපතිවරයා තෝරා ගැනීමේ ඡන්ද විමසීම ඇතුළු සිය සේවා කාලය තුළ මුහුණදීමට සිදුවූ ඉතාම අභියෝගාත්මක අවස්ථා නිවැරදිව කළමනාකරණය කළා - නියෝජ්‍ය කථානායක අජිත් රාජපක්ෂ**

■ **පුරා වසර 29ක් මුළුල්ලේ ඉටුකළ අගනා සේවය, පාර්ලිමේන්තුවේ කාර්ය පටිපාටි සහ පිළිවෙත් පිළිබඳව එතුමා සතුවූ පුළුල් දැනුම ඉතා ඉහළින් අගය කරනවා - සේවය ඇගයීමේ යෝජනාව ඉදිරිපත් කරමින් සභානායකවරයා පවසයි.**

පසුගිය 23 වැනිදා සිට සේවයෙන් විශ්‍රාම ගනු ලැබූ පාර්ලිමේන්තුවේ හිටපු මහලේකම් ධම්මික දසනායක මහතාගේ සේවය අගයමින් පක්ෂ විපක්ෂ මන්ත්‍රීවරු රැසක් මැයි මස 25 වැනිදා පාර්ලිමේන්තුවේදී අදහස් පළ කළහ.

සම්ප්‍රදානුකූලව පාර්ලිමේන්තුවේ මහලේකම්වරයෙකු විශ්‍රාම ගත්විට සේවය ඇගයීමේ යෝජනාවක් ඉදිරිපත් කිරීම සඳහා කාලය වෙන් කිරීම සිදුවේ. මේ අනුව අද පාර්ලිමේන්තුවේ පෙ.ව 9.30 - ප.ව 12.30 කාලය හිටපු මහලේකම් ධම්මික දසනායක මහතාගේ සේවය ඇගැයීමේ යෝජනාව සඳහා වෙන් කර තිබිණි මෙහිදී සභාවේ අවසරය මත කථානායක අසුනට පහලින් පිහිටි ලේකම් මඬුල්ලේ ආසනයකට හිටපු මහලේකම්වරයාට කථානායකවරයා විසින් ආරාධනා කිරීම සිදුවිය.

අනතුරුව පාර්ලිමේන්තුවේ සභානායක අමාත්‍ය සුසිල් ප්‍රේමජයන්ත මහතා විසින් හිටපු මහලේකම් ධම්මික දසනායක මහතාගේ සේවය ඇගැයීමේ යෝජනාව ඉදිරිපත් කරන ලදී. ධම්මික දසනායක මහතා පුරා වසර 29ක් මුළුල්ලේ ඉටුකළ අගනා සේවය, පාර්ලිමේන්තුවේ කාර්ය පටිපාටි සහ පිළිවෙත් පිළිබඳව එතුමා සතුවූ පුළුල් දැනුම මෙම පාර්ලිමේන්තුව ඉතා ඉහළින් අගය කරන බව එම යෝජනාව ඉදිරිපත් කරමින් සභානායකවරයා පැවසීය. එසේම රාජකාරි ඉටුකිරීමේදී එතුමා සතුවූ දැඩි කැපවීම ද පොදු රාජ්‍ය මණ්ඩලීය පාර්ලිමේන්තු සංගමයේ ආසියානු කලාපීය ලේකම් ලෙස කටයුතු කිරීමෙන් පොදු රාජ්‍ය මණ්ඩලය තුළත් ඉන් පිටතදීත් විවිධ පාර්ලිමේන්තු මන්ත්‍රී සංගම්වලදීත් එතුමාගෙන් ලැබුණු විශිෂ්ට දායකත්වය කෘතගුණපූර්වකව සලකන බවත් සේවය ඇගයීමේ යෝජනාව ඉදිරිපත් කරමින් ඒ මහතා වැඩිදුරටත් පැවසීය.

මෙහිදී අදහස් දක්වමින් අග්‍රාමාත්‍ය ගරු දිනේෂ් ගුණවර්ධන මහතා ප්‍රකාශ සිටියේ පාර්ලිමේන්තුව තුළ විවිධ අභියෝගාත්මක අවස්ථාවලදී ස්වාධීනව සහ ශක්තිමත්ම මුහුණ දීමට හිටපු මහලේකම්වරයාට හැකියාව හිමිවූ බවයි. කථානායකවරුන් හත් දෙනෙකු යටතේ මෙන්ම ආණ්ඩු ගණනාවක් තුළ පාර්ලිමේන්තුවේ ස්වාධීනත්වය සහ ගෞරවය ආරක්ෂා කිරීමට එතුමා සමත්වූ බව අග්‍රාමාත්‍යවරයා පෙන්වා දුන්නේය. එසේම පාර්ලිමේන්තුවෙන් ජනාධිපතිවරයා තෝරා ගැනීමේ ඡන්ද විමසීම ඇතුළු එතුමාගේ සේවා කාලය තුළ මුහුණදීමට සිදුවූ ඉතාම අභියෝගාත්මක අවස්ථා නිවැරදිව කළමනාකරණය කිරීමේ හැකියාව හිටපු මහලේකම්වරයාට ලැබුණු බව නියෝජ්‍ය කථානායක අජිත් රාජපක්ෂ මහතා මෙහිදී අදහස් දක්වමින් පැවසීය.

විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස මහතා මෙහිදී පෙන්වා දුන්නේ පාර්ලිමේන්තුවේ ආංශික අධීක්ෂණ කාරක සභා ස්ථාපිත කිරීම ඇතුළු වඩාත් ප්‍රජාතාන්ත්‍රික සාධනීය පියවරයන් සඳහා හිටපු මහලේකම්වරයා විශිෂ්ට කාර්ය භාරයක් ඉටු කළ බවයි. සිය අත්දැකීම් ඇසුරෙන් මතු පරපුරට ප්‍රයෝජනවත් වන ග්‍රන්ථයක් පළ කරන ලෙස විපක්ෂ නායකවරයා හිටපු මහලේකම්වරයාගෙන් ඉල්ලීමක් ද කළේය. එසේම ව්‍යවස්ථාදායක සභාවේ ලේකම්වරයා ලෙස ඉදිරියේදී මෙහෙවරක් සිදුකිරීමට සුබ පතන බව ඒ මහතා පැවසීය.එසේම විපක්ෂයේ ප්‍රධාන සංවිධායක ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා ද සුභාශිංශන එක් කරමින් පවසා සිටියේ ධම්මික දසනායක මහතාගේ විශිෂ්ට සේවය ප්‍රශංසනීය බවයි. හිටපු කථානායක පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු චමල් රාජපක්ෂ මහතා මෙහිදී අදහස් දක්වමින් ප්‍රකාශ කර සිටියේ හිටපු මහලේකම්වරයාට පොදුරාජ්‍ය මණ්ඩලීය පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ සම්මේලනය ඇතුළු ජාත්‍යන්තර සම්මේලන සහ කටයුතුවලදී ඉහළ ගෞරවයක් සහ පිළිගැනීමක් හිමිවූ බවයි. එසේම පාර්ලිමේන්තුවට ගංවතුර පැමිණි අවස්ථාවකදී ඉටිපන්දම් එළියෙන් පාර්ලිමේන්තු කටයුතු සිදු කළ බවත් ඒ සෑම අභියෝගාත්මක අවස්ථාවකදීම එතුමා විශාල ශක්තියක් වූ බව හිටපු කථානායකවරයා සිහිපත් කළේය.







අනතුරුව පක්ෂ විපක්ෂ මන්ත්‍රීවරයන් රැසක් හිටපු මහලේකම්වරයාගේ සේවය අගය කරමින් සුබපැතුම් එක් කළහ. වෙසෙසින් පාර්ලිමේන්තුව තුළ පක්ෂ විපක්ෂ සෑම පාර්ශවයකින්ම ඇතැම් අවස්ථාවලදී එල්ලවන පීඩනය මනා ලෙස කලමනාකරණය කරගනිමින් අපක්ෂපාතීව සෘජුව කටයුතු කිරීමට එතුමාට හැකිවූ බවත් ඒ අනුව එතුමාගේ විශිෂ්ට සේවය ප්‍රශංසනීය බවත් බොහෝ මන්ත්‍රීවරයන් පෙන්වා දුන්හ. හිටපු මහලේකම්වරයාගේ බිරිඳ වන නීතීඥ සලිනි නිල්මල්ගොඩ මහත්මිය, දරුවන් ඇතුළු ඥාතීන් පිරිසක් ද විශේෂ අමුත්තන්ගේ ගැලරියේ සිට මෙම අවස්ථාව නැරඹීමට එක්ව සිටියහ.

# හිටපු මහලේකම් ධම්මික දසනායක මහතා පිළිබඳ කෙටි හැඳින්වීමක්

කොළඹ ඩී. එස්. සේනානායක විද්‍යාලයෙන් සහ රාජකීය විද්‍යාලයෙන් අධ්‍යාපනය ලබා ඇති ධම්මික දසනායක මහතා සිය එල්.එල්.බී (නීතිඥ) සහ එල්. එල්. එම් (නීතිපති) උපාධි සම්පූර්ණ කළේ කොළඹ විශ්වවිද්‍යාලයෙනි. ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයෙක් වශයෙන් දිවුරුම් දීමෙන් අනතුරුව 1988 දී එතුමා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ නීති උපදේශක (පර්යේෂණ) ලෙස පත්විය.

ධම්මික දසනායක මහතා රජයේ අධිනීතිඥයෙක් ලෙස 1989 වසරේ දී නීතිපති දෙපාර්තමේන්තුවේ සේවයට එක් වී ගාල්ල, කොළඹ, ගම්පහ, රත්නපුර, හලාවත, පානදුර, මීගමුව සහ අවිස්සාවේල්ල ඇතුළු මහාධිකරණ රැසකම රජය වෙනුවෙන් නඩු කටයුතු මෙහෙයවා තිබේ, තව ද, ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියේ පවරන ලද මූලික අයිතිවාසිකම් කඩවීම් පිළිබඳ නඩු කටයුතු මෙන්ම අභියාචනා අධිකරණය ඉදිරියේ පවරන ලද අපරාධ නඩු අභියාචනා රැසක්ම සඳහා එතුමා රජය වෙනුවෙන් පෙනී සිට ඇත.

1994 දී, පාර්ලිමේන්තුවේ සහකාර මහලේකම්වරයා ලෙස සිය පාර්ලිමේන්තු වෘත්තීය දිවිය ආරම්භ කළ ධම්මික දසනායක මහතා, 2003 දී පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහලේකම් ධුරයට පත් වූ අතර 2012 වසරේදී පාර්ලිමේන්තුවේ මහලේකම් ධුරයට උසස් විය.

දසනායක මහතා සිය දීර්ඝකාලීන පාර්ලිමේන්තු වෘත්තීය දිවිය තුළදී දේශීය සහ අන්තර්ජාතික ඇගයුමට ලක් වූ රාජ්‍යතාන්ත්‍රික කටයුතු රැසකට දායක වී ඇති අතර එතුමා අන්තර් පාර්ලිමේන්තු සංගමයේ (IPU), පොදුරාජ්‍ය මණ්ඩලයීය පාර්ලිමේන්තු සංගමයේ (CPA) සහ සාර්ක් පාර්ලිමේන්තු සංගමයේ සමුළු බොහෝ ගණනක් සඳහා ශ්‍රී ලංකාව නියෝජනය කොට තිබේ.

පොදුරාජ්‍ය මණ්ඩලයීය පාර්ලිමේන්තු සංගමයේ පාර්ලිමේන්තු මහ ලේකම්වරයන්ගේ සංසදයේ දකුණු ආසියානු කලාපය නියෝජනය කරමින් කෘත්‍යාධිකාරී මණ්ඩලයේ සාමාජිකත්වය ද, 2010 - 2012 කාලවකවානුවේ දී දකුණු ආසියානු කලාපීය මහලේකම්වරයන්ගේ සංසදයේ ලේකම් ධුරයද, සාර්ක් කථානායකවරයන්ගේ සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ගේ සංසදයේ ලේකම්වරයා වශයෙන් ද කටයුතු කර ඇත. එසේම, පොදුරාජ්‍ය මණ්ඩල පදනම විසින් 2000 වර්ෂයේ දී පාර්ලිමේන්තු පරිපාලන කටයුතු සඳහා වූ අධිශිෂ්‍යත්වයක් ද දසනායක මහතා වෙත පිරිනමා ඇත.

ධම්මික දසනායක මහතා වසර 29ක පාර්ලිමේන්තු සේවා කාලයක් සපුරමින් 2023.05.22 දින විශ්‍රාම දිවියට එළඹෙන්නේ ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ 06 වැනි මහ ලේකම්වරයා ලෙසයි.



# ශ්‍රී ලංකා - සෞදි අරාබි පාර්ලිමේන්තු මිත්‍රත්ව සංගමයේ සභාපතිවරයා ලෙස අමාත්‍ය නසීර් අහමඩ් මහතා තේරී පත් වෙයි

ශ්‍රී ලංකා - සෞදි අරාබි පාර්ලිමේන්තු මිත්‍රත්ව සංගමයේ අභිනව සභාපතිවරයා ලෙස පරිසර අමාත්‍ය ගරු නසීර් අහමඩ් මහතා තේරී පත් විය.

ශ්‍රී ලංකා - සෞදි අරාබි පාර්ලිමේන්තු මිත්‍රත්ව සංගමයේ නව වැනි පාර්ලිමේන්තුවට අදාළ නිලධාරී මඩුල්ල තෝරා පත්කර ගැනීමේ විශේෂ රැස්වීම ගරු කථානායක මහින්ද යාපා අබේවර්ධන මහතාගේ ප්‍රධානත්වයෙන් මැයි මස 10 වැනිදා පාර්ලිමේන්තුවේදී පැවැත්විණි. ශ්‍රී ලංකාවේ සෞදි අරාබි තානාපති කාලිඩ් බින් හමුද් බින් නසාර් අල් කහ්තානි (Khalid bin Hamoud bin Nasser Al - Qahtani) මහතා විශේෂ ආරාධිතයා ලෙස සහභාගී වූ අතර මෙම අවස්ථාවට පාර්ලිමේන්තුවේ මහලේකම් ධම්මික දසනායක මහතා ද එක්ව සිටියේය.



අමාත්‍ය ගරු විදුර වික්‍රමනායක, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වන ගරු ජේ.සී අලවතුවල සහ ගරු. එස්. එම්.එම් මුෂාරෆ් යන මහත්වරු උප සභාපතිවරුන් ලෙස මෙහිදී තේරී පත් වූහ. එසේම පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු රිෂාඩ් බදියුදීන් මහතා ලේකම්වරයා ලෙස තේරී පත් විය. තවද ගරු ඉෂාක් රහුමාන් සහ විජිත හේරත් යන මන්ත්‍රීවරු පිළිවෙලින් සහකාර ලේකම් සහ භාණ්ඩාගාරික තනතුරු සඳහා තේරී පත් විය.



කථානායක ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා මෙහිදී අදහස් දක්වමින් ප්‍රකාශ කර සිටියේ මෙරට ජලය, බලශක්තිය, සෞඛ්‍ය, මාර්ග සහ අධ්‍යාපනය යන ක්ෂේත්‍රවල විවිධ ව්‍යාපෘති 15කට අදාළව ඩොලර් මිලියන 425 කට ආසන්න සංවර්ධන ණය ප්‍රමාණයක් ලබා දීම සම්බන්ධව සිය සිය ස්තූතිය පළ කරන බවයි.

එහිදී අදහස් දැක්වූ නව සභාපති පරිසර අමාත්‍ය ගරු නසීර් අහමඩ් මහතා ප්‍රකාශ කළේ ශ්‍රී ලංකාව සහ සෞදි අරාබිය අතර සබඳතා තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා කටයුතු කිරීමට තමන් අපේක්ෂා කරන බවයි.




# ශ්‍රී ලංකාවේ තායිලන්ත තානාපතිවරයා සහ කථානායකවරයා අතර හමුවක්









ශ්‍රී ලංකාවේ තායිලන්ත තානාපති පොජ් හාන්පොල් මහතා ගරු කථානායක මහින්ද යාපා අබේවර්ධන මහතා මැයි මස 09 වැනිදා හමුවිය.

පාර්ලිමේන්තු පරිශ්‍රයේදී පැවති මෙම හමුවේදී දෙරට අතර ද්වීපාර්ශ්වික සබඳතා තරකර ගැනීම පිළිබඳව සාකච්ඡා වූ අතර ශ්‍රී ලංකා තායිලන්ත පාර්ලිමේන්තු මිත්‍රත්ව සංගමය නැවත පිහිටුවීමේ අවශ්‍යතාව ද අවධාරණය කෙරිණි.

තවද බෞද්ධ රටවල් ලෙස තායිලන්තයේ සහ ශ්‍රී ලංකාවේ බෞද්ධ කටයුතු අතර සබඳතාව ශක්තිමත් කිරීමට අපේක්ෂා කරන බවත් තායිලන්තයේ අතිපූජනීය සෝම්දේජ් අරියවොංසෝකතායන් හිමිගේ 96 වැනි ජන්මදින සැමරුම මෙරට සංඝරත්නයේ ද සහභාගීත්වය මත පැවැත්වීමට සැලසුම්කර ඇති බවද මෙහිදී සාකච්ඡා විය.

මෙම අවස්ථාවට පාර්ලිමේන්තු මහලේකම් ධම්මික දසනායක මහතා ද සහභාගී විය.

# වෙසක් පොහොය නිමිත්තෙන් පාර්ලිමේන්තුවේදී විශේෂ ධර්ම දේශනයක්









පාර්ලිමේන්තු කාර්යමණ්ඩලීය බෞද්ධ සංගමය විසින් වෙසක් පොහොය නිමිත්තෙන් වාර්ෂිකව සංවිධානය කරනු ලබන විශේෂ ධර්ම දේශනය මැයි මස 16 වැනිදා පාර්ලිමේන්තු පරිශ්‍රයේදී පැවැත්විණි.

කලුබෝවිල ශ්‍රී දේවානන්ද ධර්මායතනාධිපති, රත්නපුර උඩකරවිට ශ්‍රී ඉසිපතනාරාමාධිපති රාජකීය පණ්ඩිත, ශාස්ත්‍රපති පූජ්‍ය හගරංගල සුමේධ හිමියන් විසින් ධර්මදේශනය ඉදිරිපත් කරන ලදී.

නියෝජ්‍ය කථානායක ගරු අජිත් රාජපක්ෂ, පාර්ලිමේන්තුවේ මහලේකම් ධම්මික දසනායක, නියෝජ්‍ය මහලේකම් සහ කාර්ය මණ්ඩල ප්‍රධානී කුෂානි රෝහණදීර, සහකාර මහලේකම්වරුන් වන ටිකිරි කේ. ජයතිලක සහ හංස අබේරත්න යන මහත්ම මහත්මීහු ඇතුළු පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලය මේ සදහා සහභාගී වූහ.

# කාරක සභා පුවත්



# උසස් අධ්‍යාපනයේ ප්‍රතිසංස්කරණ රැසක් පිළිබඳව කෝප් කමිටුවෙන් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට නිර්දේශ

- අවිචාරවත් ලෙස ආචාර්ය සහ මහාචාර්ය තනතුරු නාමයන් භාවිතා කිරීම වැලැක්වීම සඳහා වන නෛතික ප්‍රතිපාදන මසක් ඇතුළත සකසා ප්‍රසිද්ධ කරන ලෙස උපදෙස්
- ලකුණු ක්‍රමවේදයට අමතරව ප්‍රායෝගික පරීක්ෂණ පවත්වමින් විශ්ව විද්‍යාල වලට කරන බඳවා ගැනීම් අත්හිටුවීමටත් නිර්දේශයක්
- රැකියා වෙළඳපොළට උචිත පරිදි විශ්ව විද්‍යාල අධ්‍යාපනයේ ගුණාත්මක බව වැඩි කිරීමටත් නිර්දේශ
- උසස් අධ්‍යාපනය සහ සප්ත වාර්ෂික නිවාඩු මත විදේශගතව යළි නොපැමිණි ආචාර්යවරුන්ගෙන් අයවිය යුතු රු. බිලියන 2 ක හිඟ මුදල් ලබා ගැනීමට කඩිනම් වැඩපිළිවෙලක්
- වි.වි ප්‍රතිපාදන කොමිෂමේ බලතල ඉවත්කිරීම කිරීම වෙනුවට වත්මන් අවශ්‍යතාවන්ට ගැළපෙන පරිදි කොමිෂන් සභාව තවදුරටත් ශක්තිමත් කිරීමට කමිටුව අවධාරණය කරයි



පාර්ලිමේන්තු මන්ත්‍රී මහාචාර්ය ගරු රංජිත් බණ්ඩාර මහතාගේ සභාපතිත්වයෙන් මැයි මස 28 වැනිදා රැස්වූ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවට (කොප් කමිටුව), මෙරට විශ්වවිද්‍යාල පද්ධතිය සහ උසස් අධ්‍යාපනයට අදාළ ගැටලු රැසක් පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව කැඳවා තිබිණි.

මෙහිදී කෝප් කමිටුව විසින් අවධානයට යොමු කළ මූලික කරුණු 10 ක් ඔස්සේ සාකච්චාව සිදුවිය.

1. මුදල් අමාත්‍යාංශය නිකුත් කර ඇති චක්‍රලේඛ පිළිපැදීම සම්බන්ධ ගැටලු.

2. ලකුණු ක්‍රමවේදයට පරිභාහිරව ඇතැම් විෂයන් සඳහා යෝග්‍යතා පරීක්ෂණ පැවැත්වීම හරහා ඉහළ අගයක් සහිත ඇතැම් සිසුන්ට අසාධාරණයක් සිදුවීම.

3. විශ්ව විද්‍යාල ආචාර්යවරුන්ට ගෙවීම් සඳහා පැමිණීම තහවුරු කිරීමට නිසි ක්‍රමවේදයක් නොමැතිවීම.

4. නිසි නියාමනයක් නොමැතිවීම හේතුවෙන් අනීතිකව ආචාර්ය, මහාචාර්ය තනතුරු භාවිතා කිරීම.

5. පෞද්ගලික විශ්ව විද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතන මගින් ප්‍රදානය කරනු ලබන උපාධි සම්බන්ධව නියාමනය.

6. ජාතික විශ්ව විද්‍යාල පද්ධතියේ ගුණාත්මක බව ඉහළ නැංවීම සහ රැකියා වෙළඳපොලට ගැළපෙන පරිදි පාඨමාලා සැකසීමේ අවශ්‍යතාව.

7. විශ්ව විද්‍යාල අර්ථසාධක අරමුදල (UPF) අවභාවිතාවට ලක්වන බැවින් එය පාලනයකට නතුකිරීමේ අවශ්‍යතාව.

8. විශ්ව විද්‍යාල පද්ධතියේ මානව සම්පත් කළමනාකරණය සඳහා පූර්ව අවබෝධයකින් යුතුව කටයුතු කිරීම.

9. විදේශීය ශිෂ්‍යයන් වැඩි වශයෙන් ආකර්ෂණය කර ගැනීමේ වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාව.

10. විශ්ව විද්‍යාල ආචාර්යවරුන් උසස් පෙළ ප්‍රශ්න පත්‍ර ඇගයීමෙන් බැහැරව ඇති අවස්ථාවක එම කාර්ය නැවත ආරම්භ කිරීමට සාධනීය මැදිහත්වීමක් සිදු කිරීම.



මෙරට විශ්ව විද්‍යාල පද්ධතියේ ගුණාත්මක බව වැඩිකිරීම සහ රැකියා වෙළඳපොළට ගැළපෙන උපාධිධාරීන් බිහිකිරීම සම්බන්ධයෙන් කාරක සභාවේ විශේෂ අවධානය යොමුවිය. 2021 වසරේ විශ්ව විද්‍යාල ප්‍රවේශය හිමිවන පිරිසෙන් 26%ක් කලා මාධ්‍යයෙන් උසස් පෙළ හැදෑරූ පිරිසක් බවත් විද්‍යා විෂයයන් සඳහා විශ්ව විද්‍යාල ප්‍රවේශය ලබන පිරිස සාපේක්ෂව අඩු අගයක් බවත් මෙහිදී හෙළිවිය. නමුත් ලොව දියුණු රටවල විද්‍යා හා තාක්ෂණික විෂයයන්ගෙන් සරසවි වරම් ලබන පිරිස වැඩි බව පෙන්වා දුන් කාරක සභාව අවධාරණය කළේ මෙම තත්ත්වය වෙනස් කිරීම සඳහා පියවර ගතයුතු බවයි.



මෙරට උසස්පෙළ සහිත පාසැල් සංඛ්‍යාව 2952 ක් බවත් ඉන් විද්‍යා විෂයයන් හැදෑරීමට අවස්ථාව ඇත්තේ පාසැල් 1011 ක පමණක් බවත් ඒ අනුව පාසැල් 1941 ක විද්‍යා විෂයන් ඉගැන්වීම සිදු නොවන බවත් විශ්ව විද්‍යාල කොමිෂන් සභාවේ සභාපති මහාචාර්ය සම්පත් අමරතුංග මහතා පැවසීය. එනම් උසස්පෙළ සහිත පාසැල්වලින් 65.75% ප්‍රමාණයක විද්‍යා විෂයන් නොමැතිවීම ගැටලුවක් බවත් මෙහිදී සාකච්ඡා විය. ඔවුනි අධ්‍යාපන ක්‍රමය ඔස්සේ මේ සඳහා විසඳුම් සෙවීම ආරම්භ කොට ඇති බවත් මෙම ගැටලුව විසඳීමට පියවර ගන්නා බවත් අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්වරයා මෙහිදී පැවසීය. මේ සඳහා කඩිනමින් මැදිහත්වී උසස් අධ්‍යාපනයේදී විද්‍යා හා තාක්ෂණික අංශය සඳහා වැඩි සිසුන් ප්‍රමාණයක් යැවීමට අවශ්‍ය වැඩ පිළිවෙලක් සකස් කරන ලෙස අමාත්‍යාංශ ලේකම්වරයාට උපදෙස් දුන්නේය.

නවීණ තොරතුරු තාක්ෂණික ක්‍රමවේද හඳුන්වා දීම නිසා ප්‍රමාදයකින් තොරව විශ්ව විද්‍යාල සඳහා සිසුන් බඳවා ගැනීම ඇතුළු කොමිෂන් සභාවේ වැඩපිළිවෙල අගය කෝප් කමිටුව පවසා සිටියේ තවදුරටත් මෙරට විශ්ව විද්‍යාල ජාත්‍යන්තර මට්ටමට වැඩිදියුණු කළ යුතු බවයි. විශේෂයෙන් ජාත්‍යන්තර සිසුන් මෙරට විශ්ව විද්‍යාලවලට වැඩි වශයෙන් ගෙන්වා ගැනීමේ වැඩ පිළිවෙලක් සකස් කර ලෙස ද උපදෙස් ලබා දෙන ලදී.

වසරකට රු 90,000ක මුදලට විවෘත විශ්ව විද්‍යාලය මගින් මෘදුකාංග ඉංජිනේරු උපාධි පාඨමාලාවක් ආරම්භකොට ඇති බවත් මෙහිදී අනාවරණය විය. සාමා- න්‍යයෙන් පෞද්ගලික විශ්ව විද්‍යාලයක රු. මිලියන 2-3ක් පමණ වටිනාකමක් සහිත මෙම උපාධිය රු. ලක්ෂ 3කට වඩා අඩු මුදලකට හැදෑරිය හැකි බවත් කොමිෂන් සභා සභාපතිවරයා පෙන්වා දුන්නේය. එබැවින් දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු හරහා මේ පිළිබඳව ජනතාව දැනුවත් කිරීමට පියවර ගන්නා ලෙස කමිටු සාමාජිකයෝ කොමිෂන් සභාවට මෙහිදී උපදෙස් දුන්හ.

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ බලතල ඉවත්කිරීම කිරීම වෙනුවට වත්මන් අවශ්‍යතාවන්ට ගැළපෙන පරිදි කොමිෂන් සභාව තවදුරටත් ශක්තිමත් කිරීමේ අවශ්‍යතාව කමිටුව විසින් පෙන්වා දෙන ලදී. උසස් අධ්‍යාපන ආයතනවල තත්ත්ව නිශ්චය (Quality Assurance) සඳහා නව පනතක් මඟින් වෙනම ආයතනයක් පිහිටුවීම සම්බන්ධ යෝජනාව පිළිබඳවද අවධානය යොමුවිය. කමිටුව පෙන්වා දුන්නේ ඒ සඳහා බලය විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවටම හිමිවීම වඩා යෝග්‍ය බවයි. කොමිෂන් සභාවට මේ සඳහා බලතල හිමියුත්තේ ඇයිද යන්න සවිස්තරාත්මකව කමිටුවට මාසයක් ඇතුළත දැනුම් දෙන ලෙස කමිටුව විසින් නිර්දේශ කරන ලදී. එසේම ඒ පිළිබඳව මැදිහත්වීමට කෝප් කමිටුව සූදානම් බවද කෝප් සභාපතිවරයා පැවසීය.

උසස් අධ්‍යාපනය සඳහා විදේශගතව යළි නොපැමිණි ආචාර්යවරුන්ගෙන් රු. බිලියන 2කට ආසන්න මුදලක් අයවිය යුතු බවත් මෙහිදී අනාවරණය විය. අදාළ ඇපකරුවන්ගෙන් හෝ මෙම මුදල අයකර ගැනීමට කටයුතු කළයුතු බව කමිටු සාමාජික මන්ත්‍රීවරු පෙන්වා දුන්හි මෙසේ විදෙස්ගතවූ ආචාර්යවරු 617 ක පිරිසකගෙන් 84 ක් පමණක් මේවන විට අදාල ගෙවීම් සිදුකළ බව මෙහිදී හෙළිවියී ඒ අනුව මීට අදාළව ගන්නා ක්‍රියාමාර්ග පිළිබදව මසක් තුළ කොප් කමිටුව දැනුවත් කරන ලෙස කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

විශ්ව විද්‍යාල ප්‍රවේශයේදී ඇතැම් විෂයන්ට අදාළව ප්‍රායෝගික පරීක්ෂණ පැවැත්වීම පිළිබදව අවධානය යොමු කළ කමිටුව පෙන්වා දුන්නේ මේ හරහා ඉහළ අගයක් ලබා ගත් සිසුන්ට අසාධාරණයක් සිදුවීමේ හැකියාවක් පවතින බවයි. එම විෂයයන් සඳහා උසස්පෙළ විභාගයේදීද ප්‍රායෝගික පරීක්ෂණයක් පවත්වා අගය ලබා දෙන බැවින් තවදුරටත් ප්‍රායෝගික පරීක්ෂණයක් අනවශ්‍ය බව අවධාරණය කෙරිණි. ඒ අනුව කෝප් කමිටුව අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්වරයාට නිර්දේශ කළේ මේ සම්බන්ධයෙන් තීරණයක් වහාම ගන්නා ලෙසයි.

විගණකාධිපතිවරයා විසින් දිගින් දිගටම පෙන්වා දී තිබූ පරිදි, විශ්ව විද්‍යාල ආචාර්යවරුන්ගේ ගෙවීම් සහතික කිරීම සඳහා පැමිණීම තහවුරු කර ගැනීමේ ක්‍රමවේදයක් කඩිනමින් සකස් කරන ලෙස ද කාරක සභාව විසින් කොමිෂන් සභාවට නිර්දේශ කරන ලදී.

ඇතැම් පුද්ගලයන් විසින් විවිධ ආයතනවලින් අනීතික ලෙස ලබා දෙන ආචාර්ය, මහාචාර්ය තනතුරු භාවිතා කිරීම සම්බන්ධයෙන් කමිටුවේ විශේෂ අවධානය යොමුවිය. කොමිෂන් සභාවේ සභාපතිවරයා මෙහිදී පෙන්වා දුන්නේ මේ සඳහා ක්‍රියාමාර්ග ගැනීමට කොමිෂන් සභාවට නෛතික ප්‍රතිපාදන නොමැති බවයි. මේ හරහා ආචාර්ය මහාචාර්ය තනතුරු පවා තනතුරු පවා හෑල්ලුවට ලක්වන බැවින් කොමිෂන් සභාව මේ සඳහා මැදිහත් විය යුතු බව කමිටුව විසින් අවධාරණය කරන ලදී. මේ අනුව මාසයක් තුළ මේ සඳහා සිදුකළ යුතු නෛතික වෙනස්කම් ඉදිරිපත් කරන ලෙස දැනුම් දීම සිදුවිය.

මෙකී සියලු නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගති සමාලෝචනය සඳහා නැවත මාස දෙකකින් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව කැඳවීමට ද මෙහිදී තීරණය විය.









# ළමා වින්දිතයන් සහ චූදිතයන් මාධ්‍ය මගින් නිරාවරණය කිරීම වැලැක්වීම සඳහා වහා පියවර ගත යුතුයි - ළමයින් පිළිබඳ පාර්ලිමේන්තු සංසදයේ සභාපති රෝහිණී කුමාරි විජේරත්න

ළමා වින්දිතයන් සහ චූදිතයන් මාධ්‍ය මගින් නිරාවරණය කිරීම හේතුවෙන් විශාල සමාජ ගැටළු රැසක් ඇතිවී තිබෙන බවත් ඒ නිසා එය වැලැක්වීම සඳහා වහා පියවර ගත යුතු බවත් ළමයින් සඳහා වන පාර්ලිමේන්තු සංසදයේ සභාපති පාර්ලිමේන්තු මන්ත්‍රී රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය අවධාරණය කළාය. ඒ මහත්මිය මේ බව සඳහන් කළේ ළමයින් සඳහා වන පාර්ලිමේන්තු සංසදය මැයි මස 24 වැනිදා පාර්ලිමේන්තුවේදී රැස්වූ අවස්ථාවේදීය.

කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීමේ අමාත්‍යාංශය හා ඊට අනුබද්ධිත ආයතන වන පරිවාස සහ පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව, ජාතික ළමා රක්ෂක අධිකාරිය සහ ජනමාධ්‍ය අමාත්‍යාංශය හා ඒ යටතේ ක්‍රියාත්මක වන ආයතන වන සහ ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව, ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව රාජ්‍ය, ස්වාධීන රූපවාහිනී සේවය, ලේක්හවුස් ආයතනය සහ රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව යන රාජ්‍ය මාධ්‍ය ආයතන මෙම සංසදය වෙත කැඳවා තිබිණි.

විශේෂයෙන් ළමා අපයෝජන සහ ළමා අපචාර සිදු වන අවස්ථා වලදී ළමයින්ගේ අනන්‍යතාවන් මාධ්‍ය මගින් හෙළිදරව් කිරීම මගින් අදාළ දරුවන්ගේ ජීවිත වලට විශාල බලපෑමක් එල්ල වන බව මෙහිදී සාමාජික මන්ත්‍රීවරයන් විසින් පෙන්වා දෙන ලදී.

මෙහිදී රාජ්‍ය මාධ්‍ය ආයතන නිලධාරීන් පෙන්වා දුන්නේ දරුවන් සම්බන්ධ ප්‍රවෘත්ති ප්‍රචාරය කිරීමේදී තම ආයතන ප්‍රමිතියක් අනුගමනය කරන බවයි.

ඒ අනුව සංසද සමාජිකත්වය එකඟ වූයේ මේ පිළිබඳ තවදුරටත් සාකච්ඡා කිරීම සඳහා ඊළඟ රැස්වීම සඳහා සියළු මාධ්‍ය ආයතන කැඳවිය යුතු බවයි.

එයට අමතරව මෙරට ළමා නිවාසගත දරුවන්ගේ තත්වය වැඩි දියුණු කිරීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග පිළිබඳව දීර්ඝ වශයෙන් සංසදයේදී සාකච්චඡා කෙරිණි. එහිදී අවම ප්‍රමිති මාලාවන්ට අනුවවත් අදාළ ආයතන පවත්වා ගැනීම, ළමුන් රැක බලා ගන්නා කාර්ය මණ්ඩල වල හිඟකම, මෙම ස්ථාන වල සනීපාරක්ෂාව ප්‍රමාණවත් නොවීම, දරුවන්ට ප්‍රමාණවත් පරිදි මනෝ සමාජීය ප්‍රතිකාර ලබාදීම, වයස අවුරුදු 18 සම්පූර්ණ වූ විට ළමා නිවාසගත දරුවන් සමාජගත කිරීමේ ක්‍රියාවලිය, ළමා නිවාසවල සිටින දරුවන්ගේ ආරක්ෂාව පිළිබඳ ගත යුතු ක්‍රියාමාර්ග සහ ළමා නිවාස නිසි අධීක්ෂණයට යටත් කිරීම ආදී කරුණු පිළිබඳ දීර්ඝ වශයෙන් සාකච්ඡා කෙරිණි.

ළමා අයිතිවාසිකම් පිළිබඳ ජිනීවා කමිටුව ශ්‍රී ලංකාවේ ළමා නිවාස සම්බන්ධයෙන් නිර්දේශ ලබා දී ඇති බවත් එහිදී පුහුණු කාර්ය මණ්ඩල හිඟකම, ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන වෙන් කිරීම ආදි කරුණු රැසක් දැක්වෙන බවත් නිලධාරීහු මෙහිදී පෙන්වා දුන්හ.

ළමා නිවාස ගත දරුවන්ට වෘතීය පුහුණුව ලබාදිමේ වැදගත්කම පිළිබඳ මෙහිදී දීර්ඝ වශයෙන් කරුණු ඉදිරිපත් වූ අතර, අවුරුදු 18 ඉක්මවූ දරුවන් සමාජගත කිරීටම් සුදුසු වැඩපිළිවෙලක අවශ්‍යතාවය සහ ඔවුන්ට ස්වයං රැකියාවල නිරතවීමට අවශ්‍ය පරිසරය නිර්මාණය කිරීමේ වැදගත්කමද මෙහිදි අවධාරණය කෙරිණි.

එයට අමතරව ළමයින් සඳහා විකල්ප රැකවරණ යෝජනා ලෙස කැපකරු මාපිය ක්‍රමයක් හඳුන්වාදීම, ඥාතීන්ගේ රැකවරණයට දරුවන් පත් කිරීම, දේශීය හදාවඩා ගැනීම්, ආදී කරුණු පිළිබඳවද සංසදයේදී සාකච්ඡා කෙරිණි.

එමෙන්ම ළමා සැකකරුවන් සම්බන්ධයෙන් වන යෝජනා ලෙස සුළු වරදවල් සඳහා සමථ මණ්ඩලය වෙත යොමු කිරීම, වෙනත් විකල්ප දණ්ඩනයන්ට යටත් කිරීම, ආයතනික විශෝධනය අවසාන විකල්පය ලෙස භාවිත කිරීම ආදී කරුණු පිළිබඳවද මෙහිදී අවධානය යොමු විය.



# රූපවාහිනී නාලිකා ශ්‍රේණිගතකිරීමේ ක්‍රමය (Rating) නිවැරදි නැහැ - ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම් අනූෂ පැල්පිට මහතා

රූපවාහිනී නාලිකා ශ්‍රේණිගතකිරීමේ ක්‍රමය (Rating) නිවැරදි නොවන බවත් එය අක්‍රමවත් සහ පක්ෂග්‍රාහී ආකාරයකට සිදුවන්නක් බවත් ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම් අනූෂ පැල්පිට මහතා පැවසීය.

ඒ මහතා මේ බව පැවසුවේ රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ 2019, 2020 සහ 2021 වර්ෂවල විගණකාධිපති වාර්තා සහ වර්තමාන කාර්යසාධනය පිළිබඳ පරීක්ෂාකිරීම සඳහා රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව රාජ්‍ය අමාත්‍ය ගරු ලසන්ත අලගියවන්න මහතාගේ සභාපතිත්වයෙන් මැයි මස 25 වැනිදා පාර්ලිමේන්තුවේදී රැස් වූ අවස්ථාවේදී ය.

මෙහිදී වැඩිදුරටත් අදහස් දක්වමින් අනූෂ පැල්පිට මහතා සඳහන් කළේ රේටින් ලබාගැනීම ගණනය කිරීම සඳහා අහඹු ලෙස තෝරාගත් රූපවාහිනී යන්ත්‍ර 400ක පමණ උපකරණයක් සවිකොට දත්ත ලබාගන්නා බවයි. මෙහිදී ප්‍රධාන මාධ්‍ය ආයතන තුනක් පමණ එම ගණනය කිරීම් සිදු කරණ ආයතනවලට මුදල් ලබාදී මෙම උපකරණ සවිකළ රූපවාහිනී යන්ත්‍ර 300 පමණ මිලදීගෙන ඇති බවත් මේ නිසා ලැබෙන දත්ත නිවැරදි නොවන බවත් ඒ මහතා පෙන්වා දුනනේය.








එසේම රාජ්‍ය මාධ්‍ය සඳහා පෞද්ගලික මාධ්‍ය ආයතනවලට වඩා වැඩි වගකීමක් පවතින බැවින් නාලිකා ශ්‍රේණිගතකිරීමේදී ඉදිරියට පැමිණීම අරමුණුකොටගෙනම කටයුතු කළ නොහැකි බවත් හෙතෙම සඳහන් කළේය.

එසේම මාධ්‍යවේදීන් සඳහා හැඳුනුම්පත් නිකුත් කිරීම පිළිබඳවද මෙහිදී සාකච්ඡා වූ අතර වඩාත් සක්‍රීයව ප්‍රවෘත්ති ලබාදීමට දායකත්වය ලබාදෙන මාධ්‍යවේදීන් ඇගයීමේ ක්‍රමයක් සකස්කිරීම සම්බන්ධයෙන්ද මෙහිදී කමිටුවේදී සාකච්ඡා කෙරිණි.

තවද මෙම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අරමුණු ලෙස දක්වා තිබූ කාර්යයන් 18ක වර්තමාන ක්‍රියාකාරීත්වය පිළිබඳවද සාකච්ඡා විය. විශේෂයෙන්ම මෙහිදී විදේශ

කටයුතු අමාත්‍යාංශ හරහා දේශීය තොරතුරු විදේශීය රටවලටත්, විදේශ තොරතුරු මෙරට ජනතාවටත් ලබාදීම සම්බන්ධයෙන් ක්‍රමවත් වැඩපිළිවෙළක් සකස්කිරීම පිළිබඳ දීර්ඝව සාකච්ඡා කෙරිණි.

රුපියල් මිලියන 108ක් වැයකොට ප්‍රංශයෙන් මිලදීගත් දැනට භාවිතයෙන් ඉවත් කළ තාක්ෂණයක් සහිත නෙගටිව්පට යොදන යන්ත්‍රය සහ පොසිටිව්පට සෝදන යන්ත්‍රය පිළිබඳවද මෙහිදී සාකච්ඡා විය. මෙහිදී පැමිණ සිටි නිලධාරීන් පෙන්වා දුන්නේ 1999 වර්ෂයේ මෙම යන්ත්‍රය මිලදීගෙන ඇති බවත් මේ වන විට මෙම තාක්ෂණය යල් පැනගොස් ඇති බවත්ය. එසේම මෙම යන්ත්‍රය එක් වරක් හෝ භාවිතයට ගෙන නොමැති බවත් එය චීනච්චට්ටිවලින් නිපදවා ඇති බැවින් යකඩ වලට විකිණීම හෝ කළ නොහැකි බවත් නිලධාරීන් පෙන්වා දුන්නේය.

එසේම ස්වාධීන රූපවාහිනීසේවය සහ ජාතික රූපවාහිනී සංස්ථාව ලාබ ලබන තත්ත්වයට පත්කිරීම පිළිබඳවද, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරී සැලැස්ම සහ එහි ප්‍රගතිය සම්බන්ධයෙන්ද මෙහිදී සාකච්ඡා විය.







# දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට 2022 දෙසැම්බර් 31 දින වන විට ලැබිය යුතු මුලු හිඟ බදු, දඩ හා පොළී මුදල රුපියල් බිලියන 904 ක් - කෝපා කමිටුවේදී හෙලි වෙයි

■ RAMIS පරිගණක පද්ධතිය තවමත් නිසි ක්‍රියාකාරී මට්ටමක නැහැ

RAMIS සහ Legacy පරිගණක පද්ධතිවලට අදාළව දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට 2022 දෙසැම්බර් 31 දින වන විට ලැබිය යුතු මුලු හිඟ බදු, දඩ හා පොළී මුදල රුපියල් 904,342,180,778 ක් බව (බිලියන 904) කෝපා කමිටුවේදී අනාවරණය විය.

මෙම මුදලෙන් රුපියල් 163,425,093,401 ක් (බිලියන 163) අය කළ හැකි ආදායම් වශයෙන් හඳුනාගෙන ඇති බවත් රුපියල් 740,917,087,377 ක් (බිලියන 740) යම් යම් හේතු මත අය කිරීම් තාවකාලිකව අත්හිටවා ඇති මුදල් වශයෙන් හදුනාගෙන ඇති බවත් මෙහිදී අනාවරණය වුණි.

එසේම RAMI සහ Legacy යන පද්ධති දෙක යටතේම අයවිය යුතු මුලු හිඟ බදු මුදල් වශයෙන් මෙම මුදල හඳුනාගෙන ඇති බව ද මෙහිදී විගණකාධිපතිවරයා විසින් පෙන්වාදෙන ලද අතර මෙම හිඟ බදු මුදලින් අය කළ හැකි ආදායම් මුදල අය කර නොගැනීම පිළිබඳව මෙහිදී දීර්ඝ ලෙස සාකච්ඡා විය.

මෙහිදී මෙම කාරක සභාවේ සභාපති රාජ්‍ය අමාත්‍ය ගරු ලසන්ත අලගියවන්න මහතා නිර්දේශ කළේ අය කළ හැකි ආදායම් වශයෙන් හඳුනාගෙන ඇති හිඟ බදු මුදල් කොටස් වශයෙන් හෝ අයකරගන්නා ආකාරය පිළිබඳ දින වකවානු සහිතව තොරතුරු ඇතුළත් වාර්තාවක් කෝපා කමිටුවට ලබා දෙන ලෙසයි. එසේම රුපියල් බිලියන 904 මුලු හිග බදු මුදල පිළිබඳව වෙන්වෙන් වශයෙන් විස්තර සහිතව වාර්තාවක් ලබා දෙන ලෙස ද සභාපතිවරයා නිර්දේශ කළ අතර එම වාර්තාවේ බදු මගහැරී ඇති ආකාරය සහ ඒවාට හේතු විස්තරාත්මකව දක්වා තිබිය යුතු බවද සඳහන් කළේය.

මේ පිළිබඳ අනාවරණය වුයේ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ වර්තමාන කාර්යසාධනය සහ මෙම දෙපාර්තමේන්තුව 2022 නොවැම්බර් 28 දින කෝපා කමිටුවට කැඳවා ලබාදුන් නියෝග ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය සමාලෝචනය කිරීම සඳහා රජයේ ගිණුම් පිළිබඳ



කාරක සභාව රාජ්‍ය අමාත්‍ය ගරු ලසන්ත අලගියවන්න මහතාගේ සභාපතිත්වයෙන් මැයි මස 12 වැනිදා පාර්ලිමේන්තුවේදී රැස් වූ අවස්ථාවේදී ය.

එසේම RAMIS පරිගණක පද්ධතිය නිසි ක්‍රියාකාරී මට්ටමක නොපැවතීම පිළිබඳවද මෙහිදී සාකච්ඡා වූ අතර මෙම පද්ධතිය සකස් කළ පසු ක්‍රියාත්මක කිරීමට පුහුණු නිලධාරීන් නොමැතිවීම පිළිබඳවදමෙහිදී සාකච්ඡා වියි. එබැවින් ඒ සඳහා සුදුසු වැඩපිළිවෙළක් සකස් කිරීම අවශ්‍යතාවද මෙහිදී සඳහන් විය.

එසේම 2022.11.28 දින පැවති කෝපා කමිටු සාකච්ඡා-වට අනුව 2022 ජුනි 30 වන විට රුපියල් 2,488,003,615 (බිලියන 2.4) වටිනා අගරු වූ චෙක් පත් පැවතීම පිළිබඳව ද මෙහිදී සාකච්ඡා විය. විශේෂයෙන්ම බදු මුදල් ගෙවීමේදී 90% පමණ ලංකා බැංකුව මාර්ගයෙන් බදු මුදල් ගෙවීම සිදු කරන බවත් මෙසේ ගෙවන බදු මුදල් ගෙවූ දින අනුමත වූ බව පෙන්වුවත් පසු දින අගරු චෙක්පත් ලෙස පෙන්වන බවත් මෙහිදී පැමිණ සිටි නිලධාරීහු පෙන්වා දුන්හ. මේ අනුව කාරක සභාවේ සභාපතිවරයා විසින් ලංකා බැංකුවේ සභාපතිවරයා කමිටුව අතරතුරුදීම දුරකථන මාර්ගයෙන් සම්බන්ධකරගනිමින් සාකච්ඡා කොට අදාළ උපදෙස් ලබාදීම ද මෙහිදී සිදු විය.

තවද කැසිනෝ ව්‍යාපාරය සඳහා දල එකතුව මත බදු අය කිරීම පිළිබඳවද මෙහිදී සාකච්ඡා විය.

# වෘත්තීය පුහුණු අධිකාරියේ පරිපාලනය සම්පූර්ණයෙන් බිඳ වැටිලා - අධ්‍යක්ෂ ජනරාල් ඇතුළු ප්‍රධාන තනතුරු 7 ක් පුරප්පාඩු - කෝප් කමිටුවේදී අනාවරණය වෙයි

- අධ්‍යක්ෂ ජනරාල්වරිය අනිවාර්ය නිවාඩු යැවීම ඇතුළු හිටපු සභාපතිවරයාගේ අනීතික පරිපාලන තීන්දු නිසා සිදුවූ අලාභය පියවා ගැනීම ඇතුළු ඉදිරි පියවර සම්බන්ධයෙන් පරීක්ෂණයක් පවත්වා සති දෙකක් තුළ වාර්තා කරන ලෙස අමාත්‍යාංශයට දන්වයි
- කැඳවීමක් ලබාදී තිබියදී කමිටුව මඟහරිනලද හිටපු සභාපතිවරයා නැවත කැදවීමටත් තීරණයක් රැකියා වෙළඳපොළට උචිත පරිදි විශ්ව විද්‍යාල අධ්‍යාපනයේ ගුණාත්මක බව වැඩි කිරීමටත් නිර්දේශ
- එවැනි පුද්ගලයන් රාජ්‍ය අංශයේ තනතුරු සදහා යළි පත් නොකරන ලෙසටත් ජනාධිපති ලේකම්වරයා ඇතුළු බලධාරීන්ට දන්වා සිටීමටත් තීරණය කෙරේ
- මූල්‍ය අධ්‍යක්ෂ ඇතුළු ආයතනයේ ප්‍රධාන තනතුරු 7 ක්ම පුරප්පාඩුව පවතින බවත් අනාවරණයක්
- නව අධ්‍යක්ෂ ජනරාල්වරියක් පත් කිරීමේ කටයුතු කඩිනම් කිරීමටත් උපදෙස්
- අධිකාරියේ අරමුණට පරිබාහිරව සිදුකර ඇති කටයුතු පිළිබඳවත් කමිටුවේ දැඩි අවධානය

2023 මාර්තු 23 වැනිදා පවත්වන ලද පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය සමාලෝචනය සදහා වෘත්තීය පුහුණු අධිකාරිය මැයි 09 වැනිදා ගරු මහාචාර්ය රංජිත් බණ්ඩාර මහතාගේ සභාපතීත්වයෙන් රැස්වූ කෝප් කමිටුවට කැඳවා තිබිණි.

මෙහිදී විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ අනුව පහත සදහන් කරුණු කෙරෙහි කමිටුවේ මූලික අවධානය යොමු විය.

අධ්‍යක්ෂ ජනරාල්වරිය අනීතිකව අනිවාර්ය නිවාඩු යැවීම ඇතුළු වැරදි පරිපාලන තීන්දු පිළිබඳ හිටපු සභාපතිවරයාගේ ක්‍රියාකලාපය සහ අධිකාරියේ පරිපාලනය සම්පූර්ණයෙන් බිඳ වැටීම.

හිටපු සභාපතිවරයා විසින් වෘත්තීය පුහුණු අධිකාරියේ හිටපු අධ්‍යක්ෂ ජනරාල්වරිය නීත්‍යානුකූල නොවන ලෙස අනිවාර්ය නිවාඩු යැවීම කමිටුවේ දැඩි දෝෂදර්ශනයට ලක්විය. අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් නොමැතිව මෙය සිදු කර ඇතිබවත් තවත් තනතුරු 10 ක අදාළ පුද්ගලයන් රාජකාරියක් නොමැතිව මාරු කර ඇති බවත් මෙහිදී අනාවරණය විය.

මෙම සභාපතිවරයාගේ ක්‍රියාකලාපය නිසා රජයට හා



ආයතනයට විශාල මූල්‍ය පාඩුවක්ද සිදුව ඇතිබවත් අධිකාරියේ පරිපාලනය ඉතා බරපතල තත්ත්වයකට වැටී ඇති බවත් කෝප් සභාපතිවරයා පෙන්වා දුන්නේය.

මෙම තත්ත්වය හමුවේ අමාත්‍යාංශයේ මැදිහත් වීම ප්‍රමාණවත් නොවන බවත් මෙම විෂය සම්බන්ධයෙන් අමාත්‍යාංශය වගකීම් විරහිතව කටයුතු කර ඇති බවත් පැවසූ කෝප් සභාපතිවරයා ඒ පිළිබඳව සිය දැඩි අප්‍රසාදය පළ කළේය.

මේ අනුව මේ පිළිබදව කඩිනම් විමර්ශනයක් සිදු කර මෙම

මූල්‍ය පාඩුව අයකර ගැනීම ඇතුළු ඉදිරි ක්‍රියාමාර්ග සති දෙකක් තුළ දන්වන ලෙස අමාත්‍යාංශ ලේකම්වරයාට දැනුම් දුන්නේය.

එසේම මෙවැනි පුද්ගයන් යළි රාජ්‍ය සේවයේ තනතුරු සඳහා පත් නොකිරීමට වගබලා ගැනීම සඳහා ජනාධිපති ලේකම්වරයාට, අධ්‍යාපන අමාත්‍යාංශය සහ පරිපාලන අමාත්‍යාංශවල ලේකම්වරුන්ට දන්වා සිටීමට කටයුතු කරන බවද කෝප් සභාපතිවරයා සඳහන් කළේය. එසේම අල්ලස් හා දූෂණ විමර්ශන කොමිෂන් සභාවට ද මේ සම්බන්ධයෙන් කටයුතු කිරීමට දන්වා සිටින බවද සභාපතිවරයා පැවසීය.

තවද ආයතනයේ පරිපාලනමය ගැටලු, මූල්‍ය පාලනය, ආයතනික විනය, වත්කම් කළමනාකරණය, මානව සම්පත් කළමනාකරණය යන අංශ පිළිබඳ පරීක්ෂණයක් සිදු කරන ලෙස විගණකාධිපතිවරයා විසින් අමාත්‍යාංශයට නිර්දේශයක් ලබා දුන් බවත් එහි වාර්තාව මසක් ඇතුළත කමිටුවට ලබා දෙන ලෙසත් දැනුම් දුන්නේය.

**ආයතනික සංයුක්ත සැලැස්මක් සැකසීමේ ප්‍රගතිය විමර්ශනය**

අධිකාරියේ ඉදිරි වැඩපිළිවෙල සහිත සංයුක්ත සැලැස්මක් නොතිබූ බැවින් එය සකස් කිරීමට පසුගිය කෝප් රැස්වීමේදී ලබා දුන් නිර්දේශය ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය විමර්ශනය කරන ලදී මෙහිදී අධිකාරියේ වත්මන් සභාපතිවරයා පැවසුවේ පසුගිය අප්‍රේල් 27 වැනි දින පැවැත්වූ වැඩමුලුවකදී මෙහි කටයුතු ආරම්භ කළ බවත් ඉදිරි තෙමසක කාලසීමාව තුළ නිම කිරීමට අපේක්ෂා කරන බවත්ය.

**නව අධ්‍යක්ෂ ජනරාල්වරියක් ඇතුළු පුරප්පාඩුව පවතින ප්‍රධාන තනතුරු 7 ට පත් කිරීම් සිදු කිරීම**

අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරිය මැයි මාසයේ විශ්‍රාම යාමට නියමිත බැවින් නව අධ්‍යක්ෂ ජනරාල්වරියක් පත් කිරීම සඳහා පියවර ගැනීමට ලබා දුන් පසුගිය කමිටු රැස්වීමේ නිර්දේශය පිළිබඳව ද අවධානය යොමුවිය.

එසේම මේ වන විට අධ්‍යක්ෂ (මුදල්), විගණන නිලධාරී, අධ්‍යක්ෂ (පරිපාලන) ඇතුළු ප්‍රධාන තනතුරු 7 ක් පුරප්පාඩුව පවතින බවත් ඒ අනුව පරිපාලනය මුළුමනින්ම අඩාලවී ඇති බවත් මෙහිදී හෙළි විය. එබැවින් එම තනතුරු කඩිනමින් සම්පූර්ණ කිරීමට පියවර ගන්නා ලෙසත් කමිටුව උපදෙස් දුන්නේයි නව බඳවා ගැනීම් සිදු කරනු ලබන්නේ අග්‍රාමාත්‍ය ලේකම්වරයාගේ ප්‍රධානත්වයෙන් යුතු කමිටුවක් මගින් බැවින් ඒ පිළිබඳව වහාම සොයා බලා සති දෙකකින් කමිටුවට දන්වන ලෙසද කෝප් සභාපතිවරයා අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්වරයාට දැනුම් දුන්නේය.





**අධිකාරියේ අරමුණට පරිබාහිරව සිදුකර ඇති කටයුතු කර ඇති අවස්ථා**

අහංගම හෝටල් පාසැල සංචාරක හෝටලයක් ලෙස රු. මිලියන 148 කට ආසන්න මුදලක් වැය කරමින් නවීකරණය කිරීම, පොතුවිල් හෝටල් පාසැල් පරිශ්‍රයේ සංචාරකයන්ට නවාතැන් පහසුකම් ලබා දෙන කාමර 10 ක් ඉදිකිරීම ඇතුළු කරුණු පිළිබඳව ද මෙහිදී අවධානය යොමුවිය. අධිකාරියේ අරමුණුවලින් පරිබාහිව විශාල මුදලක් වැය කරමින් මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කළද අද වන විට මේවා පවත්වාගෙන යාමට අසීරු තත්ත්වයක් උදා වී ඇති බව අනාවරණය විය.

**රැකියා වෙළඳපොළට ගැළපෙන පරිදි වෘත්තීය පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම**

මේවන විට කොරියාවේ පුහුණු වෙල්ඩින් ශිල්පීන් 10,000කට ආසන්න ප්‍රමාණයකට ඉල්ලුම තිබුණද දැනට මෙරටින් යවා ඇත්තේ 300 කට ආසන්න ප්‍රමාණයක් බව අනාවරණය වියි මේ අනුව රැකියා වෙළඳපොළ ඉලක්ක කරගනිමින් පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාව අවධාරණය කරන ලදී. මේ සඳහා පෞද්ගලික අංශයේද සහය ලබා ගෙන ක්‍රියාත්මක කළ හැකි වැඩසටහන් සංයුක්ත සැලැස්මට ඇතුළත් කොට ක්‍රියාත්මක කරන ලෙස කෝප් සභාපතිවරයා උපදෙස් ලබා දෙන ලදී.

මිලියන 50 ක ආසන්න මුදලක් වෙන් කර තිබියදීත් අවශ්‍ය පුහුණු භාණ්ඩ සහ උපකරණ මිලදී ගෙන නොතිබීම, ආරම්භ නොකරන ලද ව්‍යාපෘති සඳහා විශාල වියදමක් දරා තිබීම ආදි කරුණු පිළිබඳව මෙහිදී විමර්ශන කටයුතු සිදුවිය.

# නීති විරෝධී සංක්‍රමණ වැළැක්වීම සඳහා වෙනම ඒකකයක් ක්‍රියාත්මක කොට මාස තුනකින් ප්‍රගතිය වාර්තා කරන ලෙස විශේෂ කාරක සභාවෙන් අදාළ අංශවලට උපදෙස්

නීතිවිරෝධී සංක්‍රමණ වැළැක්වීම සඳහා 'ආරක්ෂිත සංක්‍රමණ ප්‍රවර්ධන ඒකකයක්' (Safe Migration Promotion Unit) මාස තුනක නියමු වැඩසටහනක් ලෙස ක්‍රියාත්මක කරන ලෙස ස්ත්‍රී-පුරුෂ සමතාව සහ සමානාත්මතාවය තහවුරු කිරීමට සහ ඒ පිළිබඳව සොයා බලා සිය නිර්දේශ පාර්ලිමේන්තුවට වාර්තා කිරීම සඳහා වූ පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව විසින් අදාළ පාර්ශ්වවලට උපදෙස් ලබා දෙන ලදී.

එම කාරක සභාව පසුගියදා පාර්ලිමේන්තු මන්ත්‍රිනි ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මියගේ සභාපතීත්වයෙන් රැස්වූ අවස්ථාවේදී මෙලෙස උපදෙස් ලබා දීම සිදුවිය.

2022 නොවැම්බර් මාසයේදී ඕමානයේ සිදුවූ බවට වාර්තා වූ මිනිස් ජාවාරම් සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග සමාලෝචනය කිරීම සඳහා මෙම රැස්වීම කැඳවා තිබුණි කම්කරු සහ විදේශ රැකියා අමාත්‍යාංශය, විදේශ කටයුතු අමාත්‍යාංශය සහ මහජන ආරක්ෂක අමාත්‍යාංශය, ආරක්ෂක අමාත්‍යාංශය සහ අධිකරණ අමාත්‍යාංශය යන ආයතනවල නිලධාරීහු රැසක් මෙම අවස්ථාවට සහභාගී වූහ.

මේ අනුව මෙම ඒකකය පිහිටුවීමෙන් සංචාරක වීසා මත ගොස් පසුව රැකියා වීසා ලබාගෙන සිදු කරනු ලබන වංචනික ක්‍රියාවන් වැළැක්විය හැකි බව පෙන්වා දුන් කාරක සභාව මෙම නියමු ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර මාස තුනක කාලයකින් වාර්තාවක් ලබා දෙන ලෙසත් උපදෙස් දෙන ලදී.

කම්කරු සහ විදේශ රැකියා අමාත්‍යාංශය, විදේශ කටයුතු අමාත්‍යාංශය සහ ආරක්ෂක අමාත්‍යාංශයෙන් සමන්විත විශේෂ කාර්ය සාධක බලකායක් හරහා මෙම ඒකකය ක්‍රියාත්මක කළ හැකි බවත් මෙහිදී සාකච්ඡා විය.





සංචාරක වීසා මත රැගෙන ගොස් ඕමානයේ රැකියා ලබා දෙන ව්‍යාජ ඒජන්තවරුන්ගෙන් අහිංසක ශ්‍රමිකයන් ආරක්ෂා කර ගැනීම සඳහා දැනට අත්හිටුවා ඇති, මීට පෙර ක්‍රියාත්මක වූ විරෝධතා නොමැති සහතික ක්‍රමය (No Objection Certificate) නැවත ස්ථාපිත කිරීමට පියවර ගන්නා ලෙසද කමිටුව විදේශ කටයුතු අමාත්‍යාංශයෙන් ඉල්ලා සිටියේය. මේ පිළිබඳව දැනටමත් ඕමාන රජය සමඟ සාකච්ඡා කර ඇති බවත් එය කඩිනම් කිරීමට පියවර ගන්නා බවත් අමාත්‍යාංශයේ නිලධාරීහු පෙන්වා දුන්හ.

පිලිපීනයේ ක්‍රියාත්මක වන දිවුරුම් පෙත්සම් ක්‍රමය ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කිරීමට ඇති හැකියාව පිළිබඳව සොයා බලන ලෙස ද පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව විදේශ රැකියා අමාත්‍යාංශයේ නිලධාරීන්ට උපදෙස් ලබා දීම සිදුවිය.

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය පනත සඳහා වූ සංශෝධන කඩිනමින් සම්මත කර ගැනීමට අපේක්ෂා කරන බව ද එමගින් උප නියෝජිතයන්, අතරමැදියන් නියාමනය නිසිපරිදි සිදු කිරීම අපේක්ෂිත බවද නිලධාරීහු මෙහිදී පෙන්වා දුන්හ. එමෙන්ම විදේශ රැකියා සඳහා පිටත්ව යාමේදී ව්‍යාජ විදෙස් රැකියා නියෝජිතායතන විසින් සිදුකරනු ලබන වංචනික ක්‍රියා සම්බන්ධයෙන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් දැනුවත් කරන ලෙස විශේෂ කාරක සභාව විදේශ සේවා නියුක්ති කාර්යාංශයට උපදෙස් ලබා දෙන ලදී.

# යූජීසී අනුමතිය ලබාදීම උපාධි ප්‍රදානය කරන විශ්ව විද්‍යාලයට පමණක් සීමා විය යුතුයි - උසස් අධ්‍යාපන අවස්ථා පුළුල් කිරීමේ විශේෂ කාරක සභාවේදී සාකච්ඡා කෙරේ

අනුබද්ධ විශ්වවිද්‍යාල සහ ඒවායේ පාඨමාලා සඳහා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය ලබා දීමේදී එය විවිධ අලෙවිකරණ අරමුණු සඳහා අනිසි ලෙස භාවිත නොකිරීමට සහ එය උපාධි ප්‍රදානය කරන විශ්වවිද්‍යාලයට පමණක් ලබා දීමට දැඩි ක්‍රියාමාර්ග ගත යුතු බවට ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපන අවස්ථා පුළුල් කිරීම සඳහා සුදුසු නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා වූ පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවේ අවධානය යොමු විය.

මේ පිළිබඳව සාකච්ඡා වූයේ ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපන අවස්ථා පුළුල් කිරීම සඳහා සුදුසු නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා වූ පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව එහි සභාපති අමාත්‍ය (ආචාර්ය) ගරු විජයදාස රාජපක්ෂ මහතාගේ ප්‍රධානත්වයෙන් මැයි මස 12 වැනිදා පාර්ලිමේන්තුවේදී රැස්වූ අවස්ථාවේදීය.

උසස් අධ්‍යාපන ක්ෂේත්‍රය පුළුල් කිරීම සඳහා ගත හැකි ඉදිරි ක්‍රියාමාර්ග පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා විශේෂ කාරක සභාව විසින් වෘත්තීයවේදීන් සහ සංගම් කැඳවා තිබිණි හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වන ආචාර්ය මොහාන් ලාල් ග්‍රේරු සහ එම්.එම්.එම්. මුස්තාපා, තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව, ලංකා - ජර්මානු කාර්මික පුහුණු ආයතනය, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය, රෝයල් ඉනිස්ටිටියුට් ආයතනයේ සභාපති ජී.ටී. බණ්ඩාර යන මහත්වරු ඇතුළු පිරිසක් මෙම අවස්ථාවට සහභාගි වූහ.



තවද ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය (SLIATE) සහ ඊට අනුබද්ධ උසස් තාක්ෂණික ආයතනය (ඔෂ) යන ආයතන වල ශිෂ්‍ය සංගම් නියෝජිතයින්ද කාරක සභාව හමුවට කැඳවා අදහස් ලබා ගන්නා ලදී.

එමෙන්ම උසස් පෙළ ප්‍රතිඵල ලැබීම සහ විශ්වවිද්‍යාල ප්‍රවේශය අතර පවතින කාලය සිසුන්ට ප්‍රයෝජනවත් ලෙස භාවිත කිරීමට නිසි යාන්ත්‍රණයක් ක්‍රියාත්මක විය යුතු බව ද කමිටුවේ අදහස විය. තවද, උසස් අධ්‍යාපනයේ ගුණාත්මක බව සහතික කිරීම සඳහා විවිධ උපාධි ප්‍රදානය කරන ආයතන නියාමනය කිරීමේ අවශ්‍යතාවය පිළිබඳව ද පැවති කමිටු රැස්වීමේදී අවධානය යොමු විය.





# වීසා කාලය ඉක්මවා ඇති විදේශිකයන්ගෙන් වීසා ගාස්තු වලට අමතරව අතිවාස කාල සීමාව සඳහා අයකරනු ලබන දඩ මුදල අඩු කිරීමේ නියෝගවලට අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ අනුමතිය

වලංගු වීසා කාලය ඉක්මවා ඇති විදේශිකයන්ගෙන් වීසා ගාස්තු වලට අමතරව අතිවාස කාල සීමාව සඳහා අයකරනු ලබන ඇමරිකානු ඩොලර් 500 ක දඩ මුදල සංශෝධනය කිරීම සඳහා ආගමික හා විගාමික පනත යටතේ මහජන ආරක්ෂක අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග වලට මහජන ආරක්ෂක කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ අනුමතිය හිමිවිය.

මහජන ආරක්ෂක කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව එහි සභාපති අමාත්‍ය ගරු ටිරාන් අලස් මහතාගේ ප්‍රධානත්වයෙන් මැයි මස 25 වැනිදා පාර්ලිමේන්තුවේ රැස්වූ අවස්ථාවේ දී මෙම අනුමැතිය ලබා දෙන ලදී.

ඒ අනුව මෙම නියෝග හරහා, වීසා කාල සීමාව දීර්ඝ කර ගැනීමකින් තොරව වලංගු වීසා කාල සීමාව ඉක්මවා දින 7ක් හෝ අඩු කාලයක් තුළ රටින් පිටවන විදේශිකයන් සඳහා දඩ මුදල් අය නොකිරීමටත්, අතිවාස කාල සීමාව දින 7 කට වැඩි සහ දින 14ක් හෝ ඊට අඩු කාලසීමාවක් සඳහා ඇමරිකානු ඩොලර් 250ක දඩ මුදලක් අය කිරීමටත් හා අතිවාස කාල සීමාව දින 14කට වැඩි කාල සීමාවක් වන විට ඇමරිකානු ඩොලර් 500 ක





දඩ මුදලක් අය කිරීමටත් ප්‍රතිපාදන සකස් කර ඇත.

සංචාරක ව්‍යාපාරයේ ප්‍රවර්ධනය, ආයෝජකයින් ආකර්ෂණය කිරීම සහ ශ්‍රී ලංකාව තුල ක්‍රියාත්මක විදේශ දූත මණ්ඩලවල සේවයේ නියුතු නිලධාරීන් හට ද ඉහත දඩ මුදල් ගෙවීමට සිදුවීම හේතුවෙන් සිදුවන අපහසුතා පිළිබඳව විවිධ පාර්ශවයන් විසින් කරන ලද ඉල්ලීම් අනුව මෙම පියවර ගෙන ඇති ඒ අනුව මෙම නියෝගවලට ඉදිරි දිනයකදී පාර්ලිමේන්තුවේ අනුමතිය ලබා ගැනීමට නියමිතයි.

මෙයට අමතරව, විවිධ ස්ථානවල සහ පුද්ගලයන්ගේ ආරක්ෂාව සඳහා පොලිස් නිලධාරීන් යොදවා ඇති බැවින් පොලිස් ස්ථානවල නිලධාරීන්ගේ හිඟයක් පවතින බව මන්ත්‍රීවරු පෙන්වා දුන්හී මෙම කාර්ය දීර්ඝ කාලයක සිට ක්‍රියාත්මක වන බවත්, නිසි ආරක්ෂක තක්සේරුවක් සිදු කර අත්‍යාවශ්‍ය අවශ්‍යතා සඳහා පමණක් නිලධාරීන් යොදවන ලෙසත් අනෙකුත් නිලධාරීන් පොලිස් ස්ථානවල සේවයේ යොදවන ලෙසත් අමාත්‍ය ටිරාන් අලස් මහතා පොලිස්පතිවරයාට උපදෙස් දුන්නේය.

මේ අතර□ මත්ද්‍රව්‍ය සම්බන්ධ වැටලීම්වලට සම්බන්ධ නිලධාරීන් අගය කිරීමට පියවර ගැනීමේ අවශ්‍යතාව මන්ත්‍රීවරුන් විසින් කාරක සභාවේ අවධානයට යොමු කරන ලදී ඒ අනුව සෑම පොලිස් කලාපයකින්ම මත්ද්‍රව්‍ය වැටලීම්වලට අදාළ නිර්දේශ ලබා ගනිමින් අදාළ නිලධාරී-න් අගය කිරීමට පියවර ගන්නා ලෙස අමාත්‍යවරයා විසින් උපදෙස් ලබා දෙන ලදී.

# ජාතික ප්‍රතිපත්ති කොමිෂන් සභාව පිහිටුවීමේ මාර්ග සැලැස්ම පිළිබඳ ජාතික සභා ප්‍රතිපත්ති සම්පාදන අනු කාරක සභාවේ අවධානය



ජාතික ප්‍රතිපත්ති කොමිෂන් සභාව පිහිටුවීමේ මාර්ග සැලැස්ම පිළිබඳව කෙටි, මධ්‍යම හා දිගු කාලීන ජාතික ප්‍රතිපත්ති සම්පාදනය කිරීමේ දී ප්‍රමුඛතා හඳුනාගැනීම පිළිබඳ ජාතික සභා අනු කාරක සභාවේදී සාකච්ඡා විය.

එසේම මේ සම්බන්ධයෙන් අදාළ සියලු පාර්ශ්වයන්ගේ හා මහජන අදහස් හා යෝජනා විමසීමෙන් පසු ජාතික ප්‍රතිපත්ති කොමිෂන් සභාව පිළිබඳ පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට නුදුරේදී ඉදිරිපත්කරන බව එම අනු කාරක සභාවේ සභාපති පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු නාමල් රාජපක්ෂ මහතා පැවසීය.



මේ පිළිබඳ සාකච්ඡා කෙරුණේ කෙටි, මධ්‍යම හා දිගු කාලීන ජාතික ප්‍රතිපත්ති සම්පාදනය කිරීමේ දී ප්‍රමුඛතා හඳුනාගැනීම පිළිබඳ ජාතික සභා අනු කාරක සභාව එහි සභාපති පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු නාමල් රාජපක්ෂ මහතාගේ ප්‍රධානත්වයෙන් මේ මස පාර්ලිමේන්තුවේදී රැස් වූ අවස්ථාවේදීය.

එසේම මෙහිදී මෙරට සියලුම රාජ්‍ය ආයතන වල ප්‍රසම්පාදනය ක්‍රියාවලිය විද්‍යුත් තාක්ෂණය භාවිතයෙන් සිදු කිරීම (e-Procurement System) පිළිබඳව මින් පෙර රැස්වීමේදී දෙන ලද නියෝගයන්හි ප්‍රගතිය සම්බන්ධයෙන්ද සාකච්ඡා විය. මේ අනුව මෙම ක්‍රමවේදය ඉක්මනින් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය සැලසුම් සකස් කිරීමේ අවශ්‍යතාව මෙම අනු කාරක සභාවේ සභාපති ගරු නාමල් රාජපක්ෂ මහතා පෙන්වා දුන්නේයි ඒ අනුව මේ වර්ෂයේ ජූනි මාසය වන විට කැබිනට් අමාත්‍යාංශ සහ රාජ්‍ය අමාත්‍යාංශ කිහිපයක් සඳහා අත්හදාබැලීම් මට්ටමින් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කොට ඇති බව පැමිණ සිටි නිලධාරීහු සඳහන් කළහ.



තවද රාජ්‍ය ආයතන ඩිජිටල්කරණය කිරීම මගින් පහසු සහ ඉක්මන් සේවයක් ඇතිකිරීම පිළිබඳව මෙහිදී සාකච්ඡා වියි මේ සඳහා සැලසුම්කොට ඇති වැඩපිළිවෙළ හා එහි වත්මන් තත්ත්වය පිළිබඳව ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනයේ නිලධාරීන් ඉදිරිපත්කිරීමක් සහිතව පැහැදිලි කිරීමද මෙහිදී සිදු විය.

# ශ්‍රී ලංකාවේ පළමු න්‍යෂ්ටික බලාගාරය 2032 වන විට ඉදිකළ හැකියි - ආංශික අධීක්ෂණ කාරක සභාවේදී ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය පවසයි

සියලුම කටයුතු සැලසුම් කර ඇති අයුරින් සිදුවුවහොත් රුසියානු තාක්ෂණික සහාය ඇතිව පළමු න්‍යෂ්ටික බලාගාරය 2032 වන විට ශ්‍රී ලංකාවේ ඉදිකළ හැකි බව ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය, බලශක්ති හා ප්‍රවාහනය පිලිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේදී සඳහන් කළේය.






ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයේ වත්මන් තත්ත්වය සහ ඉදිරි කටයුතු පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා බලශක්ති හා ප්‍රවාහනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව එහි සභාපති පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු නාලක බණ්ඩාර කෝට්ටේගොඩ මහතාගේ ප්‍රධානත්වයෙන් මැයි මස 09 වැනිදා පාර්ලිමේන්තුවේදී රැස්වූ අවස්ථාවේදී මෙම කරුණ අනාවරණය විය.

ශ්‍රී ලංකාව තුළ වෑද්දුම් ශිල්පය (Welding) සහ තාක්ෂණ ක්ෂේත්‍රයේ නිපුණත්වයන් සහිත වෘත්තිකයන් බිහිකිරීම සම්බන්ධයෙන් කාරක සභාවේ දී දීර්ඝ වශයෙන් සාකච්ඡා විය. කොරියාව ඇතුළු කාර්මික රටවල මෙම ක්ෂේත්‍රයේ ප්‍රවීණයන් සඳහා විශාල ඉල්ලුමක් පවතින බවත් ශ්‍රී ලංකාවේ මෙම ක්ෂේත්‍රයේ විධිමත් සහතිකයන් සමග පුහුණු ශ්‍රමිකයන් බිහිකිරීමට විධිමත් යාන්ත්‍රණයක අවශ්‍යතාවය පිළිබඳ කාරක සභාවේ සාමාජිකයෝ පෙන්වා දුන්හ.

දැනටමත් මෙම අංශයේ වෘත්තීය පළපුරුද්ද ඇති සහ එම ක්ෂේත්‍රයට අලුතින් ඇතුළත් වන අය සඳහා පුහුණු සහ සහතික කිරීමේ ක්‍රමය මණ්ඩලය විසින් පවත්වාගෙන යනු ලබන පුහුණු මධ්‍යස්ථානයේ සිදු කරන බව නිලධාරීහු සඳහන් කළහ. එහෙත්, මෙම පුහුණුව පිළිබඳව ජනතාව අතර නිසි දැනුවත් වීමක් නොමැති බැවින් ඒ සඳහා සැලැස්මක් සකස් කර වැඩි වශයෙන් නවකයින් සම්බන්ධ කර ගැනීමට පියවර ගන්නා ලෙස කාරක සභාව විසින් උපදෙස් ලබා දෙන ලදී.

සෞදි අරාබියේ ගස් බිලියන 10ක් සිටුවීමේ ව්‍යාපෘතිය සඳහා ජීවානුහරණය කළ කොහු බත් ශ්‍රී ලංකාවෙන් ලබා ගැනීමට සෞදි අරාබිය බලාපොරොත්තු වන බව ද මෙහිදී සාකච්ඡා විය. ජීවානුහරණය සඳහා පහසුකම් ලබාදීමෙන් විශාල විදේශ විනිමය ප්‍රමාණයක් රටට ලබාගත හැකි බව කාරක සභාවේ සභාපති ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී නාලක බණ්ඩාර කෝට්ටේගොඩ මහතා සඳහන් කළේය. ඒ අනුව, මෙම ජීවානුහරණය පහසුකම සකස් කිරීමට පියවර ගන්නා ලෙස කාරක සභාව ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයට උපදෙස් දුන්නේය.

# බස් පර්යන්තයක් ඉදිකිරීම සඳහා බත්තරමුල්ල නගරයෙන් ඉඩමක් වෙන් කිරීමේ කටයුතු අවසන් කිරීමට නාගරික සංවර්ධන අධිකාරියේ ඉහළ නිලධාරීන්ට බලශක්තිය සහ ප්‍රවාහනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවෙන් නැවත කැඳවීමක් - වගකීම නිසිපරිදි ඉටු නොකිරීම පිළිබඳව කමිටුවේ දැඩි අප්‍රසාදය

- ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ පරිපාලන ගැටලු රැසක් ද සාකච්ඡාවට
- 2021 වසරේ මණ්ඩලයේ පාඩුව රු. මිලියන 3059 ක් - 2022 වසරේ ලාභය රු. මි. 485 ක්
- රියදුරු කොන්දොස්තර පුරප්පාඩු 800 ක්
- විෂමාචාර ක්‍රියා සඳහා චෝදනා ලැබූ කොන්දොස්තරවරුන් 500ක ප්‍රමාණයට වැටුප් ගෙවීම ගැටලුවක්

බස් පර්යන්තයක් ඉදිකිරීම සඳහා බත්තරමුල්ල නගරයෙන් ඉඩමක් වෙන් කිරීමේ කටයුතුවල අවසන් තීරණයක් ගැනීමට නාගරික සංවර්ධන අධිකාරිය ඇතුළු අදාළ පාර්ශව ලබන පාර්ලිමේන්තු සතියේ කැඳවන බව බලශක්තිය සහ ප්‍රවාහනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපති පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු නාලක බණ්ඩාර කෝට්ටේගොඩ මහතා මැයි මස 23 වැනිදා පැවසීය.



එසේම මේ සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමටත් කොළඹ ප්‍රධාන බස්නැවතුමේ බස් රථ, ඊළඟ ගමන් වාරය එනතුරු නවතා තැබීමට කොළඹ කොටුව ප්‍රදේශයේ සුදුසු ඉඩමක් වෙන් කිරීමේ කටයුතු කඩිනම් කිරීමටත් පාර්ලිමේන්තු මන්ත්‍රී යදාමිණී ගුණවර්ධන මහතාගේ ප්‍රධානත්වයෙන් අනුකමිටුවක් පත් කිරීමටත් මෙහිදී තීරණය විය.

බත්තරමුල්ල බස් අංගනයක් ඉදිරිකිරීම සඳහා මීට පෙර මෙම කාරක සභාවට කැඳවා තිබූ නාගරික සංවර්ධන අධිකාරියේ නිලධාරීන්ට උපදෙස් ලබා දුන්න ද ඒ සම්බන්ධයෙන් ක්‍රියාත්මක නොවීම පිළිබඳව එම අධිකාරියට කාරක සභාවේ දැඩි අප්‍රසාදය පළ විය.

එසේම බත්තරමුල්ල නගර සැලැස්ම තුළ බත්තරමුල්ල හන්දියට නුදුරු පොළ පිහිටි භූමියේ ඉඩමක් පිහිටියද මේ සම්බන්ධයෙන් මීට පෙර පැවති සාකච්ඡාවේදී අනාවරණය නොකිරීම සම්බන්ධයෙන් ද කාරක සභාව සිය අප්‍රසාදය පළ කළේය. එම භූමිය බත්තරමුල්ල මංසන්ධියට

නුදුරින් පිහිටි නිසා මාර්ග තදබදය ඇතුළු ගැටලු ඇතිවීමේ හැකියාව පවතින බව මෙහිදී එම නිලධාරීහු පැවසූහ.



එසේම මෙහිදී ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ ඉදිරි සැලසුම් සහ 2021 වාර්ෂික වාර්තාවෙන් පැන නගින කරුණු සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම සිදුවිය.

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ පරිපාලන ගැටලු රැසක්ද මෙහිදී සාකච්ඡා විය. 8 ශ්‍රේණිය සමත් පුද්ගලයන් ඩිපෝ කලමනාකරුවන් බවට පත්ව ඇති බවත් ගණකාධිකරණ, තාක්ෂණික ඇතුළු අංශ ගණනාවක තනතුරුවල ගැටලු රැසක් පවතින බව ද මෙහිදී හෙළිවිය. මැතිවරණයකින් අනතුරුව සුදුසුකම් නැති ඇතැම් වෘත්තීය සමිති නායකයන් ඩිපෝ කළමනාකාරිත්වය ඇතුළු ඉහල තනතුරුවලට පත්වන බැවින් දේශපාලන අතපෙවීම්වලින් මුදවා ගැනීමේ අවශ්‍යතාව ද මෙහිදී සාකච්ඡා විය.



එසේම 2021 වසරේ කොවිඩ් අර්බුදය ඇතුළු තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලය රු් මිලියන 3059 ක් අලාභ ලැබුවද 2022 වසරේ මණ්ඩලය රු. මි. 485 ක ලාභයක් වාර්තා කළ බවද මෙහිදී නිලධාරීහු පැවසූහ. වත්මන් ගැටලු අතර රියදුරු හා කොන්දොස්තර හිගය ප්‍රධාන බව මෙහිදී ඔවුහු පෙන්වා දුන්හ. දැනට 26 561 ක සමස්ත සේවක පිරිසක් සිටින බවද රියදුරු කොන්දොස්තර පුරප්පාඩු 800 ක් පවතින බවත් මෙහිදී අනාවරණය විය. ඒ අනුව රජයේ අනුමතිය මත මෙම බදවා ගැනීම් සිදුකිරීමට කටයුතු සිදු කරන බවද නිලධාරීහු පැවසූහ.

එසේම විවිධ විෂමාචාර ක්‍රියා සදහා චෝදනා ලැබූ කොන්දොස්තරවරුන් දිවයින පුරා ඩිපෝ 107 ක 500කට ආසන්න ප්‍රමාණයක් ඇති බවත් මෙහිදී අනාවරණය විය් පරීක්ෂණ අවසන් කරන තුරු ඔවුන්ට වැටුප් ගෙවීමට සිදුව ඇති බවද මෙහිදී නිලධාරීහු පෙන්වා දුන්හී



ආයතනයේ වැටුප් තල ඉතා පහළ අගයක් ගැනීම නව බඳවා ගැනීම්වලට විශාල ගැටලුවක් බව නිලධාරීහු පෙන්වා දුන්හ. වැටුප් සංශෝධන පිළිබදව පාර්ලිමේන්තුවේ සහ මුදල් අමාත්‍යාංශ ලේකම්වරයාගේ අවධානයට ලක්විය යුතු කරුණු දැනුම් දෙන ලෙස කාරක සභා සභාපති ගරු නාලක කෝට්ටේගොඩ මහතා නියෝග කළේය.

එසේම ඉන්ධන භාවිතය සහ කළමනාකරණය පිළිබද දළ වාර්තාවක් ද කමිටුවට ලබා දෙන ලෙස උපදෙස් දුන්නේය.

# දේශීය ආදායම් දෙපාර්තමේන්තුව ජාතික ආර්ථිකයට දක්වන දායකත්වය පිලිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සාකච්ඡා කෙරේ

## ■ බදු අභියාචනා සඳහා විශේෂ අධිකරණ ක්‍රමයක්

රජයට අයවිය යුතු රුපියල් බිලියන 950ක බදු මුදලින් අභියාචනා සහ විරෝධතා නොමැති රුපියල් බිලියන 270ක් පමණ බදු අයකර ගැනීමට දේශීය ආදායම් දෙ-පාර්තමේන්තුව කටයුතු නොකිරීම සම්බන්ධයෙන් ජාතික ආර්ථික හා භෞතික සැලසුම් පිලිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සාකච්ඡා කෙරිණි.

පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතාගේ ප්‍රධානත්වයෙන් මැයි මස 23 වැනිදා පැවැති මෙම කමිටු රැස්වීමේදී රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව (COPA) සහ ආර්ථික අර්බුයේ බලපෑම සමනය කිරීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව එක්ව දේශීය ආදායම් දෙපාර්තමේන්තුව ජාතික ආර්ථිකයට දක්වන දායකත්වය පිළිබඳව සාකච්ඡා කළහ.

මේ වන විට රටේ පවතින ආර්ථික අර්බුදය තුළ විවිධ නව බදු හඳුන්වා දී රජයේ ආදායම ඉහළ නැංවීමට රජය කටයුතු කර තිබියදී රජයට ආදායමක් ලබා දෙන විශාල ආයතනයක් ලෙස දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට මෙම ආදායම එකතු කළ හැකිද යනුවෙන් කමිටු සභාපති පාර්ලිමේන්තු මන්ත්‍රී මහින්දානන්ද අලුත්ගමගේ මහතා ප්‍රශ්න කළේය.

ඒ අනුව අභියාචනා සඳහා තිබෙන ප්‍රතිපාදනය අවභාවිතා කරමින් බදු ගෙවන්නන් බදු ගෙවීමෙන් වැළකී සිටින බවත් එවෙනි අභියාචනා කටයුතු අවසන් වීමට වසර 2-7ක පමණ කාලයක් ගත වන බවත් මේ සඳහා නීතිමය ප්‍රතිසංස්කරණ කඩිනමින් සිදු කළ යුතු බවත් කමිටුව පෙන්වා දුන්නේය.

දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට පාලනය කළ නොහැකි අධිකරණ කටයුතු සඳහා දීර්ඝ කාලයක් ගතවන නීතිමය වශයෙන් පවතින අභියාචනා ප්‍රතිපාදන නිසා මෙය සිදුවන බව දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ නිලධාරීහු පැවසූහ් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජනරාල් රංජිත් හපුආරච්චි මහතා පෙන්වා දුන්නේ වෙනත් රටවල




පවතින බදු සම්බන්ධ නඩු විභාග කිරීමට පවතින ආකාරයේ විශේෂ අධිකරණ පද්ධතියක් මෙරට පවතී නම් මෙම නීතිමය කටයුතු කඩිනමින් අවසන් කළ හැකි බවයි.

මේ සම්බන්ධයෙන් අධිකරණ අමාත්‍යවරයාගේ අවධානයට යොමු කර බදු අභියාචනා කටයුතු සඳහා විශේෂ අධිකරණ පද්ධතියක් ඇති කිරීමට පියවර ගන්නා බව කමිටු සභාපතිවරයා සඳහන් කළේය.

මේ අතර□ බදු ලිපිගොනු ලක්ෂ පහකට ආසන්න ප්‍රමාණයක් අතුරෙන්, බදු ගෙවන ලිපිගොනු සංඛ්‍යාව පිළිබඳව කමිටුව විසින් විමසා සිටින ලදී. කෙසේ වෙතත් අදාළ තොරතුරු නිලධාරීන් සතුව නොමැතිවීම හේතුවෙන් කමිටුව සිය අප්‍රසාදය පළ කළ අතර මීළඟ කමිටු රැස්වීමේදී එම තොරතුරු ලබාදෙන ලෙස උපදෙස් දෙන ලදී.

එමෙන්ම බදු නොගෙවන විශාල වෙළෙඳ සමාගම් සහ ආනයනකරුවන් පිළිබඳව ද මෙහිදී සාකච්ඡාවට බඳුන් වියී එහෙත් මේවා සම්බන්ධයෙන් නිවැරදි තොරතුරු දෙපාර්තමේන්තුව සතුව නොමැති බව මෙහිදී අනාවරණ විය. මේ අතර, රට තුළ සිදුවන දැවැන්ත ගනුදෙනුවලට අදාළ දත්ත ලබාගැනීම සඳහා නිසි ක්‍රමවේදයක් නොමැතිවීම පිළිබඳව ද කමිටුවේ සාකච්ඡා කරන ලදී එබැවින් මේවා ලබාගැනීමට අවශ්‍ය යාන්ත්‍රණයක් සකස් කළ යුතු බවත් නීති ප්‍රතිසංස්කරණ සිදුකිරීමට අවශ්‍ය සහයෝගය කමිටුව හරහා ලබා දෙන බවත් කමිටු සභාපතිවරයා පැවසීය.

ලියාපදිංචි සමාගම්වලින් බදු අයකිරීම, නව බදු ලිපිගෙ ානු ආරම්භ කිරීම□ දෙපාර්තමේන්තුවේ සේවක පුරප්පාඩු, ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල බදු නිලධාරීන් සම්බන්ධයෙන් RAMIS පද්ධතිය වැනි කරුණු පිළිබඳව ද මෙහිදී සාකච්ඡා කෙරිණි.











# විශ්‍රාම වැටුප් අප්‍රමාදව ගෙවීමේ ක්‍රමවේදය විධිමත් කර ඒ පිළිබඳ ජනතාව දැනුවත් කරන්න - විවෘත සහ වගකිවයුතු රජයක් පිලිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවෙන් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට උපදෙස්

මෙරට රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගන්නා සේවකයන් වෙනුවෙන් හිමි විශ්‍රාම වැටුප් අප්‍රමාදව ගෙවීමට සහ ඒ සඳහා ඇති වැඩපිළිවෙල පිළිබඳ ජනතාව නිසි පරිදි දැනුවත් කිරීමට පියවර ගන්නා ලෙස විවෘත සහ වගකිවයුතු රජයක් පිලිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපති පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට උපදෙස් ලබා දුන්නේය.







විශ්‍රාම වැටුප ලැබීමට දීර්ඝ කාලයක් ගතවීම නිසා ජනතාව අපහසුතාවයට පත්වන බව සඳහන් කළ සභාපතිවරයා මෙය දීර්ඝ කාලයක් තිස්සේ පවතින ගැටළුවක් බවත් ඒ පිළිබඳ පැමිණිලි නිතර ලැබෙන බවත් පැවසීය.

මෙම කරුණු සාකච්ඡා වුයේ විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විවෘත සහ වගකිවයුතු රජයක් පිලිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත කැඳවූ අවස්ථාවේදීය. උක්ත කාරක සභාව එහි සභාපති පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතාගේ ප්‍රධානත්වයෙන් මේ මස පාර්ලිමේන්තුවේදී රැස්විය.

මෙහිදී නිලධාරීන් පෙන්වා දුන්නේ නිවැරදිව සම්පූර්ණ කරන ලද විශ්‍රාම වැටුප් අයදුම්පත්‍රයක් ලැබී මසක කාලයක් ඇතුළත විශ්‍රාම වැටුප ගෙවීමේ හැකියාව පවතින බවයි.බොහෝ ගැටළු මතු වන්නේ අයදුම් පත්‍රය නිසි පරිදි සම්පූර්ණ නොවීම හේතුවෙන් බවද ඔවුහු පෙන්වා දුන්හ.


සාමාජික මන්ත්‍රීවරයන් සඳහන් කළේ සිය විශ්‍රාම වැටුප් පිළිබඳ තොරතුරු දැනගැනීමට නිසි ක්‍රමවේදයක් නොමැතිවීම හේතුවෙන් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව පිළිබඳ ජනතාව තුළ බලවත් කළකිරීමක් පවතින බවයි. ඒ නිසා මෙම ක්‍රමවේදය නවීන තාක්ෂණයද උපයෝගී කරගෙන ජනතාවට පහසුවෙන් සේවා සැලසෙන අයුරින් සැකසිය යුතු බවද මන්ත්‍රීවරු පෙන්වා දුන්හ. එමෙන්ම සෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකටම විශ්‍රාම වැටුප් සම්බන්ධව කටයුතු කිරීම සඳහා උපාධිධාරී නිලධාරියෙක් පත් කිරීමට යෝජනා කරන ලෙසද මන්ත්‍රීවරු පැවසූහ.

මෙහිදී ඒ ඒ දිස්ත්‍රික්ක වලට අදාළ විශ්‍රාමිකයන්ගේ සංගම් කමිටුව වෙත කැඳවා ඔවුන්ගේ ගැටළු සාකච්ඡා කිරීම සුදුසු බව සාමාජික මන්ත්‍රීවරයන් විසින් යෝජනා කරන ලදී.

# "ක්‍රමය වෙනස් කරන්න නම් ක්‍රමයට ඇතුල් වෙන්න" ආංශික අධීක්ෂණ කාරක සභා සමග සම්බන්ධවීමට තෝරා ගැණුනු තරුණ නියෝජිතයන් අමතමින් ජනාධිපතිතුමා පවසයි

- ලෝකයේ පළමු වතාවටයි තරුණයින්ට මේ අවස්ථාව ලැබෙන්නෙ. ඒ අවස්ථාවෙන් ප්‍රයෝජන ගන්න - ජනාධිපතිතුමා

ක්‍රමය වෙනස් කරන්න නම් ප්‍රථමයෙන්ම ක්‍රමයට ඇතුළත් වන ලෙස ආංශික අධීක්ෂණ කාරක සභා සමග සම්බන්ධවීමට තෝරා ගැණුනු තරුණ නියෝජිතයන් අමතමින් ජනාධිපති ගරු රනිල් වික්‍රමසිංහ මහතා පවසයි.



බත්තරමුල්ල වෝටර්ස් එජ් හෝටල් පරිශ්‍රයේදී පැවැත්වුණු පාර්ලිමේන්තුවේ ආංශික අධීක්ෂණ කාරක සභා සමග සම්බන්ධවීමට තෝරා ගැණුනු තරුණ නියෝජිතයන් දැනුවත් කිරීමේ විශේෂ වැඩසටහනේ සමාරම්භක උත්සවයට සහභාගී වෙමින් ජනාධිපතිතුමා මැයි මස 13 වැනිදා මේ බව පැවසීය.

මෙහිදී තවදුරටත් අදහස් දක්වමින් ජනාධිපතිවරයා සඳහන් කළේ පාර්ලිමේන්තුවේ වැඩකටයුතු වලට බාහිරින් තරුණ නියෝජිතයින් තෝරාගන්නා ලෝකයේ පළමු අවස්ථාව මෙය බවයි මේ නිසා මෙය ඓතිහාසික අවස්ථාවක් බවත් මේ ලැබෙන අවස්ථාවෙන් ප්‍රයෝජන ගන්නා ලෙස තමන් මෙම තරුණ නියෝජිතයින්ගෙන් ඉල්ලා සිටින බවත් ජනාධිපතිතුමා මෙහිදී පැවසීය.

සංශෝධනය කළ ස්ථාවර නියෝග යටතේ මෙම තරුණයින්ගේ සහභාගීත්වය සිදු වන්නේ පාර්ලිමේන්තු කමිටු සාමාජිකයින් ලෙස බවත් හුදෙක් නිරීක්ෂකයින් ලෙස නොවන බවත් මෙහිදී ජනාධිපතිතුමා වැඩිදුරටත් පැවසීයි මේ නිසා කමිටුවේ කාර්යන්වලදී මන්ත්‍රීවරුන්ගේ වාර්තාවට අමතරව මෙම තරුණ නියෝජිතයින්ගේ අදහස්ද ඉදිරිපත් කිරීමේ හැකියාව ලැබෙන බව හෙතෙම වැඩිදුරටත් පැවසීයි එබැවින් ක්‍රමවේදය වෙනස් කිරීමට ක්‍රමවේදයට ඇතුළත්වීම මුලින්ම කළයුතු බවත් ඒ සඳහා මෙය හොඳ අවස්ථාවක් වන බවත් ජනාධිපතිතුමා මෙහිදී පැවසීය.

මෙම අවස්ථාව අමතමින් ගරු අග්‍රාමාත්‍ය දිනේෂ් ගුණවර්ධන මැතිතුමා සඳහන් කළේ තරුණයන්ට මෙම අවස්ථාව සැලසීම මගින් නව සහභාගිත්ව ප්‍රජාතන්ත්‍රවාදයකට මෙරට පිවිසෙන බවයි මෙම සහභාගිත්ව ප්‍රජාතන්ත්‍රවාදය මගින් ඉතා ගැඹුරු මෙන්ම නව දේශපාලන පරිච්ඡේදයකට පිවිසීමේ වගකීම මෙම තරුණයින් ඇතුළු රජයට පැවරෙන බවයි.

මෙහිදී අදහස් දක්වමින් කථානායක ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා පැවසුවේ මේ රට තරුණ කැරලි දෙකක් සහ තිස් අවුරුදු යුද්ධයකට මුහුණදුන් රටක් බවත් එබැවින් ඉතාමත් අවාසනාවන්ත යුග කීපයක් පසු කරමින් මේ රට ඉදිරියට පැමිණ ඇති බවත් ය. එබැවින් පාර්ලිමේන්තු කමිටු හා සම්බන්ධ වන මෙම තරුණ නියෝජිතයින්ගෙන් බුද්ධිමත් සහභාගීත්වයක් බලාපොරොත්තු වන බවත් ඒ මගින් සාර්ථක අනාගත වැඩ පිළිවෙළක් බලාපොරොත්තු වන බවත් පැවසීය.

තවද විපක්ෂනායක ගරු සජිත් ප්‍රේමදාස මහතා සඳහන් කළේ රටේ අනාගතයේ හැරවුම් ලක්ෂයක් බවට මෙම අවස්ථාව පත් වනු ඇතැයි තමා විශ්වාස කරන බවයි. ඒ

නිසා විපක්ෂය ලෙස මෙම ක්‍රියාදාමය ඉතාමත් සුබවාදීව දකින බවත් ඒ මහතා පැවසීය.

එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ (UNDP) ශ්‍රී ලංකාවේ නේවාසික නියෝජිත අසූසා කුබෝටා මහතිමිය මෙම අවස්ථාව අමතමින් පැවසුවේ ගෝලීය වශයෙන් සියලු  පාර්ලිමේන්තුවල නීති සම්පාදනය, අධීක්ෂණය, නියෝජනය සහ අයවැය විමර්ශනය ඇතුළු මූලික කාර්යයන් ශක්තිමත් කිරීම කෙරෙහි UNDP ආයතනය අවධානය යොමු කරන බවයි. ඒ හරහා එහි ක්‍රියාකාරීත්වයේ පළදායීතාව වැඩිදියුණු කිරීම සඳහා කාන්තාවන් සහ තරුණයන් ඇතුළු ජනතා කැමැත්ත සහ නියෝජනය තවදුරටත් වැඩිදියුණු කිරීමට තම ආයතනය බලාපොරොත්තු වන බවයි.

එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ (UNDP) සහය සහිතව ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව විසින් මෙම වැඩසටහන සංවිධානය කරනු ලැබීයි පාර්ලිමේන්තුවේ ස්ථාපිත කරන ලද  විෂය ක්ෂේත්‍රයන් 17 කට අදාළ ආංශික අධීක්ෂණ කාරක සභා සදහා මෙම තරුණ නියෝජිතයන් පුවත්පත් දැන්වීම් පළ කිරීමෙන් අනතුරුව තෝරා ගැනීම සිදුවියී මේ අනුව ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ මහලේකම්වරයා වෙත ලැබුණු අයදුම්පත් අතුරෙන් තෝරාගත් සුදුසුකම් සහිත අවු. 18 - 35 අතර වයසේ තරුණ නියෝජිතයක් 550 කට ආසන්න පිරිසකට මෙම වැඩමුළුවට ආරාධනා කොට තිබුණි.

මෙම අවස්ථාව සඳහා ආංශික අධීක්ෂණ කාරක සභාවල සභාපතිවරුන්, පාර්ලිමේන්තුවේ මහ ලේකම් ධම්මික දසනායක මහතා, පාර්ලිමේන්තුවේ කාර්ය මණ්ඩල ප්‍රධානී සහ නියෝජ්‍ය මහ ලේකම් කුෂානි රෝහණදීර මහත්මිය, පාර්ලිමේන්තුවේ සහකාර මහ ලේකම් (ව්‍යවස්ථාදායක) ටිකිරි කේ. ජයතිලක මහතා, පාර්ලිමේන්තුවේ සහකාර මහ ලේකම් හංස අබේරත්න මහතා සහ පාර්ලිමේන්තුවේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් ඇතුළු නිලධාරීන් පිරිසක් සහභාගී වූහ.











# සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රම සඳහා ප්‍රතිලාභීන් තෝරා ගැනීමේදී නිසි ක්‍රමවේදයක් අනුගමනය කළ යුතුයි - ක්‍රම සහ විධි පිළිබඳ කාරක සභාවේදී අවධාරණය කෙරේ



සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රම සඳහා ප්‍රතිලාභීන් තෝරා ගැනීමේදී නිසි ක්‍රමවේදයක් අනුගමනය කළ යුතු බව ක්‍රම සහ විධි පිළිබඳ කාරක සභාවේදී අවධාරණය කෙරිණි.

පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු පාඨලී චම්පික රණවක මහතාගේ සභාපතීත්වයෙන් මේ මස පැවති ක්‍රම සහ විධි කාරක සභාවේදී මේ පිළිබඳව සාකච්ඡා කෙරිණි.

ජූලි මස පළමුවැනිදා සිට රජය විසින් ක්‍රියාත්මක කිරීමට නියමිත අස්වැසුම යෝජනා ක්‍රමය පිළිබඳව අදාළ නිලධාරීහු කාරක සභාව දැනුවත් කළහ. සංක්‍රාන්තික, අවදානමට ලක් වූ, දුප්පත් හා අන්ත දිළිඳු යන සමාජ කාණ්ඩ 04ක් යටතේ "අස්වැසුම" සුබසාධක ප්‍රතිලාභ ගෙවීම් සිදු කෙරෙන අතර ආබාධිත තැනැත්තන්, වැඩිහිටි සහ වකුගඩු රෝගීන් සඳහා ද සුපුරුදු පරිදි අදාළ දීමනා මෙම යෝජනා ක්‍රමය යටතේ ලබා දෙන බව නිලධාරීහු මෙහිදී පෙන්වා දුන්හ.



මෙම දීමනාව ලබා ගැනීම සඳහා අයැදුම්පත් ලක්ෂ 37කට අධික ප්‍රමාණයක් ලැබී ඇති බවත් සැබෑ අවශ්‍යතා ඇති පිරිසට මෙම දීමනාව ජූලි මස පළමු දින සිට ලබාදීමට කටයුතු කරන බවත් මෙහිදී අනාවරණය විය. සමෘද්ධි දීමනාව ලබන්නන්ගෙන් සියයට 30ක් ඒ සඳහා සුදුසුකම් නොලබන බව ලෝක බැංකුව පෙන්වා දී ඇති බවත් එය සැලකිල්ලට ගෙන මෙම යෝජනා ක්‍රමය සඳහා ප්‍රතිලාභීන් තෝරා ගත යුතු බවත් කාරක සභාවේ සභාපතිවරයා අවධාරණය කළේය.

අස්වැසුම යෝජනා ක්‍රමයෙන් ප්‍රතිලාභ ලබන ප්‍රතිලාභීන් වරින් වර ඇගයීමට ලක් කිරීමේ අවශ්‍යතාවය ද කමිටුව පෙන්වා දුන්නේය.



මේ අතර පසුගිය සතියේ පැවති මෙම කාරක සභා රැස්වීමකදී නියෝග කළ පරිදි රේගු දෙපාර්තමේන්තුව, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, සුරාබදු දෙපාර්තමේන්තුව සහ මුදල් අමාත්‍යාංශය විසින් අදාළ වාර්තා නියමිත දිනට ඉදිරිපත් නොකිරීම සම්බන්ධයෙන් කාරක සභාවේ සභාපතිවරයා සිය අප්‍රසාදය පළ කළේය.

පාර්ලිමේන්තුවේ කාරක සභාවක් මගින් වාර්තා සහ අදහස් කැඳවන විට නියමිත කාල සීමාව තුළ ඉදිරිපත් කිරීමට පියවර ගන්නා ලෙස කාරක සභාවේ සභාපතිවරයා නිලධාරීන්ට අවධාරණය කර සිටියේය.

# පාර්ලිමේන්තු ඡායා ගැලරිය



## වෙසක් පොහොය නිමිත්තෙන් පාර්ලිමේන්තුවේදී විශේෂ ධර්ම දේශනයක්













# පාර්ලිමේන්තුව සැකෙවින්...

## මැයි 2023



මෙවර සටහන - එච්. ඊ. ජනකාන්ත සිල්වා - අධ්‍යක්ෂ (ව්‍යවස්ථාදායක සේවා)/ අධ්‍යක්ෂ (සන්නිවේදන) (වැඩබලන)

### මැයි

**8 සඳුදා**

දේශීය ආදායම් සංශෝධන පනත් කෙටුම්පත 2023 අංක 4 දරන පනත වශයෙන් කථානායක ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා විසින් සහතිකය සටහන් කිරීම.

**9 අඟහරුවාදා**

දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය පාර්ලිමේන්තුවට දැනුම් දීම.

**11 බ්‍රහස්පතින්දා**

(101 අධිකාරය වූ) සිවිල් නඩු විධාන සංග්‍රහය සංශෝධනය කිරීම සඳහා වූ සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට පිළිගැන්වීම.

රතනතිස්ස සාමපදනම සංස්ථාගත කිරීමේ පනත් කෙටුම්පත පිළිබඳ ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාවේ වාර්තාව සලකා බලා තුන්වැනි වර කියවා සංශෝධිත ආකාරයෙන් සම්මත කරනු ලැබීම.

**12 සිකුරාදා**

කෙටි, මධ්‍යම හා දිගුකාලීන ජාතික ප්‍රතිපත්ති සම්පාදනය කිරීමේදී ප්‍රමුඛතා හඳුනාගැනීම සඳහා වූ ජාතික සභා අනුකාරක සභාවේ පළමුවැනි අතුරු වාර්තාව පාර්ලිමේන්තුවට පිළිගැන්වීම.

**23 අඟහරුවාදා**

පාර්ලිමේන්තුවේ මහ ලේකම් ධම්මික දසනායක මහතා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 65(5)(ඇ) ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව 2023 මැයි 23 දින සිට පාර්ලිමේන්තුවේ මහ ලේකම් ධුරයෙන් විශ්‍රාම ගිය බව පාර්ලිමේන්තුවට දැනුම් දීම.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 65(1) ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව කාර්ය මණ්ඩල ප්‍රධානී සහ පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම් කුෂානි අනූෂා රෝහණධීර මහත්මිය ගරු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතා විසින් 2023 මැයි 23 දින සිට පාර්ලිමේන්තුවේ මහ ලේකම් ධුරයට පත් කරන ලද බව පාර්ලිමේන්තුවට දැනුම් දීම.

- රතනතිස්ස සාමපදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2023 අංක 5 දරන පනත වශයෙන් කථානායක ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා විසින් සහතිකය සටහන් කිරීම.
- බැංකු (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත, පාර්ලිමේන්තු අයවැය කාර්යාලය පනත් කෙටුම්පත සහ 2018 අංක 29 දරන ගුවන් ප්‍රවාහන සංශෝධනය කිරීම සඳහා වූ ගුවන් ප්‍රවාහන (සංශෝධන) නමැති පනත් කෙටුම්පත් ත්‍රිත්වය පාර්ලිමේන්තුවට පිළිගැන්වීම.

**24 බදාදා**

- කස්තූරි ආරච්චිලාගේ ටිකිරි කුමාර ජයතිලක මහතා කාර්ය මණ්ඩල ප්‍රධානී සහ පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහලේකම් වශයෙන් පත් කිරීම.
- 2002 අංක 35 දරන ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභා පනතේ 7 වගන්තිය යටතේ එකී කොමිෂන් සභාවේ තත්කාලීන සභාපති ධුරය හා සාමාජිකත්වය දරන ජේ. ඩබ්ලිව්. එන්. ජේ. පී. කේ. රත්නායක මහතා එම සාමාජිකත්වයෙන් ඉවත් කිරීම සඳහා යෝජනාව පාර්ලිමේන්තුව විසින් සම්මත කිරීම.

**25 බ්‍රහස්පතින්දා**

- සත්ව සුබසාධනය සඳහා වන පාර්ලිමේන්තු සංසදයක් ආරම්භ කිරීම.
- පාර්ලිමේන්තුවේ මහලේකම් ධම්මික දසනායක මහතාගේ සේවය පාර්ලිමේන්තුව විසින් ඇගයීම.

**26 සිකුරාදා**

- හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී සහ හිටපු කථානායක අභාවප්‍රාප්ත ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතාගේ ශෝක යෝජනාව පාර්ලිමේන්තුව විසින් අනුමත කිරීම.

# පාර්ලිමේන්තු විත්ති

**පුවත් හසුන I 35 වැනි කාණ්ඩය I මැයි 2023**

**ISSN 2806 – 5425**

**සන්නිවේදන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ.**

දුරකථනය : +94 11 2777100 ෆැක්ස් : +94 11 2777227

www.parliament.lk

Parliament of Sri Lanka

@ParliamentLK

@slparliament

Parliament of Sri Lanka